ISSN 1391 - 1031 | 2026 පෙබරවාරි | 29 වෙළුම | 09 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=

# අපි ගොඩනගන්නේ සහෝදරත්වයෙන් පිරි රටක්

**ඇතැමුන් තැනින් තැන පුරාවස්තුවක් කේන්ද්‍ර කරගෙන හෝ ආගමික ස්ථානයක් කේන්ද්‍ර කරගනිමින් ජාතිවාදී ගැටුම් ඇවිළවීමට උත්සාහ කළද රට තුළ කිසිදු ප්‍රදේශයක කිසිදු ජාතිවාදයකට ඉඩ නොදෙන බවට ජනතාවට සහතික වූ ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා, රජයක් ලෙස තමන්ට අවශ්‍ය සියලුදෙනා සහෝදරත්වයෙන්, සමගියෙන් ජීවත්වන රටක් බව අවධාරණය කළේය.**

ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ පසුගිය 16වැනි දින චාවකච්චේරිය, මීසාලේ, වීරසිංහ ප්‍රාථමික විදුහල් ක්‍රීඩාංගණයේදී පැවති 'තමන්ගෙම තැනක්-ලස්සන ජීවිතයක්' 2026 ජාතික නිවාස වැඩසටහනේ සමාරම්භක අවස්ථාවට එක් වෙමිනි.

යුද්ධයේදී විශාල නිවාස ප්‍රමාණයක් හානියට පත් වුණා. නමුත් විශාල කාලයක් ගතවී තිබුණත් එම නිවාස මුළුමනින් ඉදිකර අවසන් කර නැහැ. මම දන්නවා මේ යාපනයේ දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාව යුද්ධය කාලයේත් අවතැන්වී සිටියා. යුද්ධයෙන් පසුවත් අවතැන් වී සිටිනවා. දීර්ඝ කාලයක් තමන්ගේම වූ නිවසක් නොමැතිව, තමන්ටම වූ තැනක් නොමැතිව පවුලක් ජීවත් වීම එතරම් යුක්ති සහගත දෙයක් නොවෙයි. ඒ නිසා අපේ කාලය ඇතුළත, යුද්ධයෙන් අවතැන් වී සිටින සියලු ජනතාවගේ නිවාස ප්‍රශ්නය අපි විසඳනවා.

## ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා

ගෙයක් නැති කෙනෙකුට ගෙයක් ලබා දෙන්න අපි කටයුතු කරන්නම්. දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දිය යුතුයි. ඒ වෙනුවෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් අපි මෙවර අයවැයෙන් වෙන් කර තිබෙනවා. හොඳ ආදායම් මාර්ගයක් සකස් කර දිය යුතුයි. විශේෂයෙන් කෘෂිකර්මාන්තය, පොල් කර්මාන්තය, ධීවර සහ කුඩා කුඩා සුළු කර්මාන්ත මේ ප්‍රදේශවල ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ග බවට පත්ව තිබෙනවා. අපේ ආණ්ඩුවේ අරමුණ එම සෑම කර්මාන්තයක් සඳහාම අවශ්‍ය සහාය ලබා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය මීට වඩා උසස් කිරීමයි. අපි ඒ වෙනුවෙන් වැඩ කරන ආණ්ඩුවක්. අපි පළමු කොටම අපි අසීරුවෙන් ජීවත්වන ජනතාවගේ ජීවිත සුවපත් කළ යුතුයි. ඒ සඳහා ආණ්ඩුක් ලෙස කළ හැකි සෑම දෙයක්ම අපි කරනවා.

මේ ප්‍රදේශවල සිටින ජනතාව විශාල බලාපොරොත්තුවකින් සහ අපේක්ෂාවකින් යුතුව මේ ආණ්ඩුව පත් කර ගැනීමට දායකත්වය ලබා දුන්නා. දීර්ඝ කාලයක් මේ පළාත්වල සිදු වුණේ පවතින ආණ්ඩුව සමග විරුද්ධ, ආණ්ඩුව සමග එකඟ නොවන මතවාදයක් ඇති වීමයි. ආණ්ඩුව ජාතිවාදය පෝෂණය කරනවා නම්, ආණ්ඩුව ජනතාවගේ දේපොළ සොරකම් කරනවා නම් ආණ්ඩුව පොදු ජනතාව ගැන කල්පනා කරන්නේ නැතිව ඒ අය ගැන විතරක් කල්පනා කරනවා නම් ජනතාව සහ ආණ්ඩුව ඈත්වීම වළක්වන්න බැහැ. ඒවා ජනතාවට විරුද්ධ ආණ්ඩු. ගැටුම් හදන ආණ්ඩු. තමන්ගේ පවුලේ අය වෙනුවෙන් විතරක් හදාගන්න ආණ්ඩු. හැබැයි අද ලංකාවේ පළමු වතාවට මේ රටේ පොදු ජනතාවගේ ආණ්ඩුවක් හැදිලා තිබෙනවා.

මෙහි සිටින දෙමාපියන් සහ සහෝදර සහෝදරියන් තමන්ගේ ජීවිත කාලයේ පළමු අවස්ථාව වෙන්න ඇති අමාත්‍යවරු, ජනාධිපතිවරු, අමාත්‍යාංශ ලේකම්වරු සහභාගි වන රැස්වීමකට සහභාගී වී සිටින්නේ. මේ බිඳුනු හදවත් අපි යා කළ යුතුයි, සැකය අවිශ්වාසය තුරන් කළ යුතුයි. අපේ පරම්පරාව යුද්ධ කර ගත්තා, ගැටුම් ඇති කර ගත්තා. අපේ දරුවන්ගේ පරම්පරාවට ගැටුම් නැති රටක්, සමගියෙන් ජීවත්වන රටක් අපි හදන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපි හැමදෙනාම එකතු වෙමු කියා ආරාධනා කරනවා.





ජනවාරි 15 දින යාපනය, වේලනෙයිහි උතුරු පළාත් තෛපොංගල් උත්සවයේදී...


**03 නිවාස 50,000ක් හදනවා...**

අපි පදිංචිවෙලා ඉන්න තැන තමයි අපේ ආර්ථික ජීවිතයත්, සංස්කෘතික ජීවිතයත්, සමාජ ජීවිතයත් කියන සියල්ල තිබෙන්නේ. ඒවා සඳහා පිළිතුරු සොයමින් තමයි වෙනත් තැන්වල පදිංචි කරන්න වෙන්නෙ. නමුත් ආණ්ඩුවක් ලෙසත්...





**05 අවලාද, අපහාස හා...**

ලෝකය ගමන් කරන්නේ ඉදිරියටය. අලුත් පරපුරත් සමග නව සංකල්ප, වටහාගැනීම් හා වඩාත් මානවාදී හා ප්‍රගතිශීලී දෘෂ්ටිවාදයත් සමග, සියලු මිනිසුන්ගේ අයිතීන්ට ගරුකරන...





**09 මිනිරන් පතලේ පාතාලය...**

අප රටේද බලය වෙනුවෙන් දූෂිත දේශපාලනය, දූෂිත රාජ්‍ය නිලධාරීන්, විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මෙන්ම දරුණු අපරාධකරුවන් සම්මුතිගතව උඩුකුරු වූ ලෝකයක් නිර්මාණය කර, පවත්වාගෙන ගිය බවට මේ වන විට සාක්ෂි...






තරුණ .................... 04
ජාත්‍යන්තර .................... 06
ආර්ථිකය .................... 07
කාන්තා .................... 08
විශේෂාංග .................... 10
වේදිකාව .................... 11


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට එරෙහි කුමන්ත්‍රණ පරාජය කරමු



අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට එරෙහි කුමන්ත්‍රණ පරාජය කරමු මැයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ වෘත්තීය සමිති නියෝජිතයෝ පසුගියදා කොළඹදී මාධ්‍ය හමුවක් පැවැත්වූහ. මෙහිදී අදහස් දැක්වූ ලංකා ගුරුසේවා සංගමයේ සභාපති ධම්මික අලහප්පෙරුම සහෝදරයා පැවසුවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අද දවසේ දැඩි අවශ්‍යතාවක් බවය. මෙම දරුවන්ට අනාගතය ජය ගැනීම වෙනුවෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විද්‍යාත්මකව සකසා ඇති බවත් දරුවන්ගේ ගුණාත්මක අධ්‍යාපනයක් වෙනුවෙන් ගුරු පරපුර සූදානම් කළ යුතු බවත් අවධාරණය කළ ඔහු සියලු කුමන්ත්‍රණයන් පරාජය කර එහි ඉදිරි ගමන නොනැවතී ඉදිරියට ගමන් කිරීමට සියලු සහාය රජයට ලබා දෙන බව ප්‍රකාශ කළේය.

මෙම මාධ්‍ය හමුවේදී, ලංකා පිරිවෙන් ගුරුසේවා සංගමයේ කොළඹ දිස්ත්‍රික් ලේකම් රාජාංගණයේ පියදස්සි හිමි, විදුහල්පති සේවා සංගමයේ ජාතික සංවිධායක සිසිර රාජපක්ෂ, අන්තර් විශ්ව විද්‍යාලයීය සේවා වෘත්තීය සමිතියේ සභාපති විජයතිලක ජයසිංහ, අන්තර් විශ්ව විද්‍යාලයීය උපශාලාධිපති සංගමයේ ලේකම් සමන්ත ප්‍රියදර්ශන යන සහෝදරවරුද මෙහිදී අදහස් දැක්වූහ.

# වැටුප් කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීමට සාකච්ඡා



වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම වෙනුවෙන් ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානයේ වෘත්තිය සමිති නායකයෝ පසුගියදා රාජ්‍ය පරිපාලන අමාත්‍ය මහාචාර්ය චන්දන අබේරත්න සහ අමාත්‍යංශ ලේකම් මෙන්ම නිලධාරීන් සමග සාකච්ඡාවක් පවත්වූහ. ජනාධිපති අනුර දිසානායක සහෝදරයා පසුගිය අයවැයේදී යෝජනා කළ පරිදි වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවක් පිහිටුවීම සම්බන්ධව පසුගියදා අමාත්‍යාංශ ලේකම්වරුන් සමඟ පැවති සාකච්ඡාවේදී තීරණය කරනු ලැබූ අතර එම තීරණයට අනුව මෙම සාකච්ඡාව පැවැත්විණි.

ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ නියෝජ්‍ය ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී චන්දන සූරියාරච්චි, රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සංගමයේ ලේකම් චන්දිම විමලසුරේන්ද්‍ර ඇතුළු රාජ්‍ය සේවාවන්, සෞඛ්‍ය ක්ෂේත්‍රය, විශ්‍රාමික වැනි ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරමින් වෘත්තීය සමිති නායකයෝ මෙම අවස්ථාවට සහභාගී වී සිටියහ.

# සටනකින් තොරවම ගුරුවරයකුට 55%-58% අතර මූලික වැටුප් වැඩිවීමක්



වර්තමාන ආණ්ඩුව බලයට ඒමට පෙර ගුරුවරයකු ලැබූ වැටුප 2026 ජනවාරි වන විට 55% ත් 58% ත් අතර ප්‍රමාණයකින් වැඩිවී තිබෙන බව ලංකා ගුරුසේවා සංගමය පවසයි. එම සංගමයේ සභාපති ධම්මික අලහප්පෙරුම සහෝදරයා මාධ්‍ය හමුවක් අමතමින් මේ බව පැහැදිලි කළේය. ඒ අනුව පළමු පන්තියේ ගුරුවරයකුගේ වර්තමාන ආණ්ඩුව බලයට පත්වීමට පෙර තිබූ මූලික වැටුප වන රු. 56,770 2026 ජනවාරි වන විට රු. 88,332 ක් දක්වා රු. 31,562 කින් වැඩි වී ඇති බවත් එමෙන්ම 2-2 ශ්‍රේණියේ ගුරුවරයකුගේ වැටුප රු. 47,175 සිට රු. 74,131 දක්වා රු. 26,706 කින් වැඩි වී තිබෙන බවත් ඔහු මෙහිදී පැවසීය. රටේ අධ්‍යාපනය දරුවන්ගේ මූලික වගකීම දරන ගුරුවරුන්ගේ වැටුප වැඩිවීම මගින් ඔවුන්ගේ වෘත්තීයට ගැලපෙන ලෙස ගුරුවරුන් ඉහළ තලයට ගෙන ඒමේ දෙවන අදියර වී තිබෙන බවත් කිසිදු වෘත්තීය සටනකින් තොරව වර්තමාන ආණ්ඩුව මෙම වැටුප් වැඩිකිරීම ලබා දී තිබෙන බවත් ඔහු මෙහිදී පෙන්වා දුන්නේය.

# වතු කම්කරුවන්ට 1750ක දිනක වැටුප පෙබරවාරි 10 සිටම



සියලු වතු කම්කරුවන් සඳහා දිනක වැටුප රු. 1750ක මුදල මෙම පෙබරවාරි සිට අනිවාර්යයෙන් ලැබෙන බවත් ඒ පිළිබඳව කිසිදු සැකයක් නොමැති බවත් සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ ප්‍රධාන ලේකම් ජේ.එම්.ඒ. ප්‍රේමරත්න සහෝදරයා මාධ්‍ය හමුවක් අමතමින් පැවසීය.

අවුරුදු 200ක ඉතිහාසය තුළ ආණ්ඩුවක් විසින් වතු කම්කරුවන්ගෙ වැටුප් වැඩි කර නැති බවත් මැතිවරණයට පොරොන්දු වූ ආකාරයෙන්ම එය ඉටු කර ඇති බවත් එසේම විපක්ෂය මෙය වැළැක්වීමට නොයෙක් ප්‍රකාශ කරමින් බලපෑම් කරද්දී පවා ආණ්ඩුව මෙම වැටුප් වැඩිවීම සිදු කර ඇති බවත් ඔහු මෙහිදී පැවසීය. මේ අතරම වතු කම්කරුවන් අතර ආණ්ඩුව විසින් ලබාදෙන රු. 200ක මුදල නොලැබී යා හැකි බවට යම් දුර්මත ඇති කරමින් තිබෙන බවත් ඒවා සියල්ල අසත්‍ය බවත් එබැවින් සියලු වතු කම්කරුවන්ට ජනවාරියට අදාළ වැටුප ගෙවන පෙබරවාරි 10වැනිදා සිට අනිවාර්යයෙන් රු. 1750 දෛනික වැටුප ලැබෙන බවත් ප්‍රේමරත්න සහෝදරයා මෙම මාධ්‍ය හමුවේදී පැවසීය. මෙම අවස්ථාවට සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී කිට්නන් සෙල්වරාජ් සහෝදරයාද එක් විය.

## අපනයන කෘෂිකර්මයට ලොකු තල්ලුවක්

පසුගිය වසර අවසානයේ ඇති වූ දිත්වා සුළි කුණාටුවෙන් විනාශ වී ගිය අපනයන කෘෂි භෝග වගාකරුවන් සඳහා වන්දි මුදල් ලබා දීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාදී තිබේ.

ජනවාරි මස 05වැනි දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය වෙත මේ සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කරන ලද අතර එය අනුමත කරනු ලැබීය. ස්වභාවික ආපදාවෙන් හානියට ලක්වූ ගම්මිරිස්, කෝපි, සහ කරදමුංගු යන අපනයන බෝග නැවත වගා කිරීම සඳහා හෙක්ටයාර් එකකට රුපියල් 425,000ක උපරිම දීමනාවක් ලබාදීමට නියමිතය. අපනයන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේදී මෙම භෝගවලින් ලැබෙන විදේශ විනිමය දායකත්වය පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් මෙම ආධාරය ලබාදීමට රජය ක්‍රියාකර තිබේ.

## මහජන සෞඛ්‍යය රැකීමට නවතම පියවරක්

බෝ නොවන රෝග හඳුනා ගැනීම සඳහා අදාළ පරීක්ෂණ පැවැත්වීම වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම හවුල්කාරිත්වයෙන් ක්‍රියාත්මක කෙරෙන නව වැඩපිළිවෙළක් දියත් කිරීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

රජයේ රෝහල්වල පවතින දිගු පොරොත්තු ලේඛනවලින් රැඳීසිටීමෙන් වැළකී අදාළ පරීක්ෂණ කඩිනමින් කර ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම මේ අනුව සිදුකෙරේ. රෝග නිශ්චය කිරීම සඳහා අවශ්‍ය සී.ටී. ස්කෑන් යන්ත්‍ර, එම්.ආර්,අයි. ස්කෑන් යන්ත්‍ර, ඩී.එස්.ඒ., හෘද කැතීතකරණ ඒකක, ස්වයංක්‍රීය රක්තවේදය හා ජෛව රසායන විද්‍යා විශ්ලේෂක උපකරණ මගින් ලබා ගන්නා වාර්තා කඩිනම් කිරීමට මේ තුළින් අපේක්ෂා කෙරේ. මේ සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රමවේද සහ මූල්‍යමය සීමා බාධක ඉවත් කිරීමට රාජ්‍ය හා පෞද්ලික අංශයේ හවුල් ව්‍යාපෘතියක් දියත් කිරීම මගින් අවධානය යොමු කරනු ලැබ ඇත.

## ඇමති බංගලා පිළිබඳ නව තීන්දුවක්

පසුගිය ආණ්ඩු කාලවලදී මැති ඇමතිවරුන් භාවිතා කළ නිල නිවාස සහ එම පරිශ්‍රයන් වඩා කාර්යක්ෂම ජනතා හිතවාදී ව්‍යාපෘති වෙනුවෙන් ලබා දීමට ඇමති මණ්ඩලය ගත් තීරණය තවදුරටත් ඉදිරිගාමීව ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන තිබේ.

මේ අනුව නිල නිවාස සහ බංගලා 24ක් මෙන්ම ඒවා පිහිටි පරිශ්‍රයන් යෝග්‍ය ආයෝජන ව්‍යාපෘති වෙනුවෙන් ලබාදීමට නියමිතය. තානාපති කාර්යාල, ජාත්‍යන්තර සංවිධාන, රාජ්‍ය තාන්ත්‍රික භාවිතයන්, රජයේ හා රජයට අනුබද්ධ ආයතන ඇතුළු ඵලදායී කටයුතු සඳහා වසර 30ක කාලයක් බදු පදනමින් ලබාදීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

## ගොවි ජනතාවට අලුත් ආදායම් අවස්ථා

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ගොවිපළවල් 17ක ඵලදායීත්වය ඉහළ නැංවීමේ අරමුණින් රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේ හවුල්කාරිත්වය මත නව ව්‍යවසායන් ඇති කිරීමට පුළුල් ඉඩකඩ ලබා දී තිබේ.

මහවැලි අධිකාරියට අයත් ඉඩම් යොදවා බිත්තර වී නිෂ්පාදනය කිරීම, අතිරේක බෝග බීජ නිෂ්පාදනය, සහ සත්ව නිෂ්පාදන කටයුතු සඳහා එම ඉඩම් යෙදවෙනු ඇත. මේ අනුව අදාළ ගොවිපළවල් ඉහළ සංවර්ධන ජාතික ඉලක්ක වෙත යොමු කිරීම වෙනුවෙන් ක්‍රියාමාර්ග රැසක් ගැනීමට නියමිතය. ගොවි ජනතාවට ගුණාත්වයෙන් යුතු බීජ සැපයීම සහ පශු සම්පත් නිෂ්පාදන ඉහළම මට්ටමකට ගෙන ඒම සඳහා ගොවි ජනතාව වෙත බදු පදනමින් මෙම ගොවිපළවල් 17ට අයත් ඉඩම් ලබාදීමට සැලසුම් කරනු ලැබ තිබේ.

## දිළිඳුකම තුරන් කිරීමට ප්‍රජාශක්ති නව ජවයකින් දිගහැරේ

දිළිඳු ජනතාව එම තත්වයෙන් මුදා ගැනීම සඳහා වත්මන් රජය විසින් හඳුන්වා දී තිබෙන ප්‍රජාශක්ති වැඩසටහන තුළින් තවත් ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කිරීමට ක්‍රියාකරමින් සිටී.

ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය මූලික ක්ෂේත්‍ර හයක් යටතේ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මෙම වසරේ අයවැය මගින් රුපියල් කෝටි 2500ක් වෙන්කර ඇති අතර, මෙයින් ප්‍රතිලාභ හිමිවන ක්ෂේත්‍ර හයකි. සමාජ පරිසරය සංවර්ධනය කිරීම, ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම, මානව සම්පත් සංවර්ධනය, රැකවරණය, නිෂ්පාදන ආර්ථිකය ඔසවා තැබීම සහ සැපයුම් ජාල ප්‍රවේශය යන ක්ෂේත්‍ර හය සඳහා මෙම මුදල් වැය කිරීමට තීරණය කර ඇති අතර, රුපියල් කෝටි 2300ක් දිස්ත්‍රික් මට්ටමින් හඳුනා ගන්නා ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කරනු ලැබ ඇත. ජාතික ව්‍යාපෘති වෙනුවෙන් සහ මධ්‍ය පරිමාණ ව්‍යාපෘති මෙන්ම පුහුණු හා පර්යේෂණ කටයුතු වෙනුවෙන් ඉතිරි රුපියල් කෝටි 200 යෙදවීමට සැලසුම් කොට තිබේ.

## 'දිත්වා' කඩා බිඳ දැමූ දුම්රිය මාර්ග ඉදිවෙයි

දිත්වා සුළි කුණාටුවෙන් විනාශ වී ගිය දුම්රිය මාර්ග යළි ඉදිකිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් මධ්‍යකාලීන සහ දිගුකාලීන පදනමින් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත.

මේ සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම සහ ඇස්තමේන්තු සකස් කිරීම මෙන්ම ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වෘත්තිකයන් යොදා ගැනීමට සැලසුම් කර ඇත. ප්‍රමාදයකින් තොරව මෙම කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් හඳුනාගෙන ඇති අතර, අවශ්‍ය උපදේශන සේවා ලබා ගැනීම සහ වෙනත් සේවා අවශ්‍යතා වෙනුවෙන් වසර දෙකක කාලයක් මෙම ආයතන දෙක ඒකාබද්ධව කටයුතු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

## රනිල් - මෛත්‍රී කැපූ විශ්‍රාම වැටුප නැවත ලබා දෙයි

මෛත්‍රීපාල සිරිසේන සහ රනිල් වික්‍රමසිංහ හවුල් ආණ්ඩුව යටතේ රාජ්‍ය සේවයට බඳවා ගත් පිරිස වැටුප් රහිතව සේවයට බඳවා ගත් අතර, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ලබාදීමට ආණ්ඩුව ක්‍රියාකරමින් සිටී.

මේ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා ඉදිරිපත් කර තිබූ සංදේශයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. මේ අනුව 2016 ජනවාරි 01වැනි දිනෙන් පසුව රාජ්‍ය සේවයට බඳවා ගෙන පරිවාස කාලය නිසි පරිදි සම්පූර්ණ කිරීමෙන් පසු සේවයේ ස්ථිර කළ සියලු දෙනා හට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීමට ක්‍රියාකර තිබේ. මේ සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛ සංශෝධනය කර, නව චක්‍රලේඛ නිකුත් කරමින් අදාළ උපදෙස් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාට ලබාදීමට නියමිතය.

## වතු කම්කරු වැටුප් වැඩිවීම ක්‍රියාත්මකයි

වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1750ක් දක්වා ඉහළ නැංවීම වෙනුවෙන් රජය දිනකට ලබාදෙන රුපියල් 200ක දීමනාව ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

මෙම ජනවාරි මස සිට එම වැටුප් ඉහළ දැමීම ක්‍රියාත්මක වන අතර 2026 අයවැය යෝජනා අනුව රජය ඒ වෙනුවෙන් රුපියල් මිලියන 5000ක ප්‍රතිපාදන වෙන්කර තිබේ. අදාළ වැටුප් වැඩිවීමට අදාළ මුදල මුල් කාලසීමාව තුළ සමාගම් මගින්ද පසුව වතු කම්කරුවන්ගේ පෞද්ගලික බැංකු ගිණුමට සෘජුවම බැර කිරීමටද අවශ්‍ය සියලු කටයුතු වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මේ වන විට පියවර ගෙන තිබේ.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# නිදහසේ සැබෑ අරුත වෙත...

මෙම පෙබරවාරි 04 දිනට ලංකාවේ 78 වැනි නිදහස් දිනය යෙදී තිබේ. පසුගිය කාලය පුරාම පැවති පාලනයන් විසින් ලාංකේය ජනතාවට නිදහස් දිනය අර්ථගන්නවා තිබුණේ ඉතාම පටු අර්ථයකිනි. ඒ, 1948දී බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් ලංකාව 'නිදහස' ලැබීම නැමති සංසිද්ධිය පදනම් කරගෙනය.

1948දී ලංකාවට පූර්ණ 'නිදහස' ලැබුණේ නැත. ලංකාව බ්‍රිතාන්‍ය කිරීටය යටතේ තබා තිබිණි. බ්‍රිතාන්‍ය සමග වූ නෛතික සබඳතා ඉවත් වූයේ 1972 ජනරජ ව්‍යවස්ථාව සම්මත කර ගැනීමත් සමගය. එහෙත් ඉන්පසුව ගෙවුණු කාලය පුරාමත් නිදහසේ ඉතාම පුළුල් අර්ථයෙන් ලාංකේය ජාතියත් ජනතාවත් 'නිදහස්' වූයේ නැත.

රටක් ආර්ථික වශයෙන් බිඳවැටී පරාධීනව පවතින්නේ නම්, රටක් විශාල ණය බරක් දරා සිටී නම්, ඒ නිසාම අයිඑම්එෆ් වැනි ආයතනවලට ගිවිසුම් මගින් බැඳී ඇත්නම් එතැන සැබෑ නිදහසක් නැත. පසුගිය කාලයේ රට පාලනය කළ අය රටට සැබෑ 'නිදහස' අත්කර දුන්නේ නැත. එහෙත් දැන් නව පාලනය තුළ සැබෑ නිදහසේ දිසාවට රට ගමන් කරවීමේ අවස්ථාව රටට ලැබී තිබේ.

රටක ජීවත්වන සියලුම ජන කොටස් අසමගියෙන් නම්, ජාතිවාදය අවුළුවා ජනතාව බෙදා තිබේනම්, ශ්‍රී ලංකිය ජාතිය තවම සම්පූර්ණයෙන් මිනිස් සිත්සතන් තුළ පවා ගොඩනැගී නැතිනම් එකම රටේ ජනයා එකිනෙකා දෙස සැකයෙන් බලන්නේ නම් එවැනි තැනක 'නිදහස' එහි සැබෑ අර්ථයෙන් පවතින්නේ නැත. ඒ නිසාම සැබෑ නිදහස සඳහා ජාතිවාදය, ආගමික අන්තවාදය පරාජය කොට ශ්‍රී ලාංකීය ජාතිය ගොඩනැගිය යුතුය. වත්මන් පාලනය දැන් පියවර ගනිමින් සිටින්නේ ඒ සඳහාය.

සමාජ ජීවිතයේදී ගැහැනිය ගේදොර වැඩකටයුතු නැමති බන්ධනයෙන් මිදී නොමැති නම්, ඇය තවමත් දෙවන පංතියේ පුරවැසියෙක් ලෙස සලකා අවමානයට ලක්කරන්නේ නම්, අපහාස කරන්නේ නම්, පීඩා කරන්නේ නම් එවිටද 'නිදහස' හුදු වචනයක් පමණක් වනු ඇත. රටක දරුවන්ට ආරක්ෂාව නොමැති නම් දරුවන්ට 'දරුවන්' ලෙස සලකන්නේ නැති නම් එතැනද නිදහසේ ගැටලු මතුවේ.

අනෙක් අතට සමාජයක් මත්ද්‍රව්‍ය වසංගතයෙන් වෙළී තිබේ නම් අපරාධ, පාතාලය ක්‍රියාත්මක වේනම්, මිනිසුන්ට බියෙන් ජීවත්වීමට සිදුව තිබේ නම්, එවිටද 'නිදහස' සැබෑ ලෙස පවතින්නේ නැත. වර්තමාන ආණ්ඩුව මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ සහ පාතාලය හා අපරාධ මැඩලීමේ අදිටනින් ක්‍රියාත්මක වීම නිදහස පිළිබඳ සැබෑ අර්ථය දිනාගැනීමට කොතරම් වැදගත් දැයි පෙනෙන්නේ මේ නිසාය.

එසේම රටක ජනතාව අතීතයේ තමන් මත පටවන ලද, සමාජ විඥානය තුළ තහවුරු කරන ලද, වැරදි, අවිද්‍යාත්මක, යල්පැනගිය අදහස් දරන්නේ නම්, රටක සාමූහිකත්වයට, එහි ඉදිරි ගමනට බාධාකරන සිරිත් විරිත් හා මතවාද තුළ දිගටම සිරවී සිටී නම් එවිටද 'නිදහස' යථාර්ථයක් නොවී පවතී. සමාජයේ හා ජනතාවගේ දෘෂ්ටිය වඩා ප්‍රගතිශීලී හා නූතන ලෝකයට ගැලපෙන ලෙස වෙනස් වීමද නිදහස හා බැඳී පවතී. එම අභියෝගයන් අප ඉදිරියේ පවතින අතර අප එම අභියෝගය ජයගත යුතුය. ඒ සැබෑ නිදහස වෙනුවෙනි. තනි වචනයෙන් කියන්නේ නම් රටක ජනතාව සැබෑ ලෙසම නිදහසේ ජීවත්වන්නේ එම රට සංස්කෘතික වශයෙන්ද දියුණු තලයකට පැමිණීමෙනි. නිදහස්, නිවහල් හා ප්‍රගතිශීලී චින්තනයක් සමාජය තුළ තහවුරු කිරීම එහිදී අත්‍යාවශ්‍ය වේ.

'නිදහස' පිළිබඳ ප්‍රශ්නයේදී රටේ නිදහස, සමාජයේ නිදහස මෙන්ම පුද්ගල නිදහසද ඉතා වැදගත්ය. මේ සියල්ල එකට පවතින්නේ නම් එම රට එම ජාතිය සැබෑ ලෙසම නිදහස ළඟාකරගත් රටක් සමාජයක් ලෙස සැලකිය හැක.

එහෙත් මේ 'නිදහසට'ද සීමා තිබේ. සැබෑ නිදහස සඳහා ජනතාව තුළ එම සීමාවන් පිළිබඳවද අවබෝධයක් තිබිය යුතුය. කෙනෙක් සතුව ඇති 'නිදහස' තවත් කෙනෙකුට හෝ සමාජයට හානිකර ලෙස යොදවන්නේ නම් එවිට 'නිදහස' විකෘති වේ. විශේෂයෙන්ම වර්තමානයේ තාක්ෂණයේ දියුණුවත් සමග ජනතාව අතට ලැබී ඇති සමහර මෙවලම් හා උපකරණ තවකෙකුට හානිකිරීමට යොදාගන්නා ආකාරය අප අත්දකිමින් සිටිමු. අනවසර ඡායාරූප ගැනීම හා පළකිරීම, කෘත්‍රිම බුද්ධි තාක්ෂණයෙන් අසත්‍ය දේ නිර්මාණය කිරීම, පුද්ගල පෞරුෂයන්ට, ගරුත්වයන්ට හානිකිරීම අප නිතර දකින දේය. සමාජ මාධ්‍ය තුළ මෙවැනි අපරිණත, වගකීම් විරහිත, අන් අයගේ ජීවිතවල සංස්කෘතික පැවැත්ම විනාශ කරන හැසිරීම් දැකිය හැක. ඒවා 'නිදහස' නොව සැබෑ නිදහසට හානියකි; බාධාවකි.

එබැවින් 'නිදහස' සමාජයේ පොදු යහපැවැත්මට, රටක ස්වාධීනත්වය හා ස්වෛරීත්වයට, පුද්ගලයන්ගේ ගෞරවයට හානි නොවනසේ කටයුතු කිරීම බව ඉතා පැහැදිලිය. සැබෑ නිදහස රටකට සමාජයකට අත්කර ගැනීම නම් එලෙස පුළුල්ව සිතන දැක්මක් සහිත ජනතාවක් නිර්මාණය කළ යුතුය. නිදහස දිනා ගැනීමේ සැබෑ අභියෝගය එය වේ.

# අභියෝගයක් වුවත් මේ වසරේ නිවාස 50,000ක් හදනවා



**නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍ය වෛද්‍ය සුසිල් රණසිංහ සහෝදරයා**

***මේ 2026 වසරේ නිවාස 50,000ක් ඉදිකිරීමේ සැලැස්මක සිටින බව නිවාස ඇමතිවරයා ලෙස ඔබ ප්‍රකාශ කර තිබුණා. ප්‍රායෝගිකව මෙතරම් විශාල ඉලක්කයක් සපුරාගන්න හැකිවේවිද?***

ඔව්. මේ ඉලක්කය විශාල අභියෝගයක්. නමුත් කළ යුතුයි. කළ හැකියි. 2025 අවුරුද්දේ නිවාස ඉදිකිරීම් අත්දැකීම් උපයෝගී කරගෙන සහ ඒ වගේම දිට්වා සුළිකුණාටුවෙන් සිදු වූ හානියට මුහුණ දුන්න අත්දැකීම් උපයෝගී කරගෙන හොඳ සැලැස්මක් සහිතවයි මේ නිවාස වැඩසටහන් ආරම්භ කර තියෙන්නේ. මේ නිවාස වැඩසටහන සාර්ථක කරගන්න රාජ්‍ය යාන්ත්‍රණය පමණක් නෙවෙයි, සම්බන්ධ කරගතහැකි සියලු පාර්ශ්ව දායක කරගෙන ජාතික වැඩසටහනක් ලෙස දියත්කරනවා. සාමූහික ප්‍රයත්නයකින් නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරන නිසා විශාල විස්වාසයක් තිබෙනවා සාර්ථක කරගන්න පුළුවන් කියල.

***ප්‍රධාන වශයෙන් යෝජිත නිවාස ව්‍යාපෘති මොනවද?***

ප්‍රධාන නිවාස වැඩසටහන් දෙකකින් තමයි මේ නිවාස පනස්දහසකට අධික නිවාස ප්‍රමාණයක් ඉදිකරන්න යන්නෙ. "ජාතික නිවාස වැඩසටහන - 2026" එක් වැඩසටහනක්. දෙවනි වැඩසටහන දිට්වා සුළිකුණාටුවෙන් හානි වූ නිවාස නැවත ගොඩනැගීමේ වැඩසටහන.

"ජාතික නිවාස වැඩසටහන - 2026" කියල අපි දියත් කරන්නෙ ආපදාව එන්න කලින් අපි 2026 වසරේ ක්‍රියාත්මක කරන්න සැලසුම් කරපු, මුදල් වෙන්කරගත් වැඩසටහනයි. අපේ අරමුණ මේ වැඩසටහන යටතේ රට පුරා නිවාස තිස්දාහකට අධික නිවාස ප්‍රමාණයක් ඉදිකරන්නයි. "තමන්ගෙම තැනක්-ලස්සන ජීවිතයක්" කියන තේමාව සහිතව මේ වැඩසටහන යටතේ නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ පහකින් සහ පළාත් සභා 9න් මේ යටතේ නිවාස ඉදිකරන්න සැලසුම් කර තියෙනවා.

නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය යටතේ නිවාස 18,500ක්, නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ නිවාස 3,800ක්, ළමා හා කාන්තා අමාත්‍යාංශය යටතේ නිවාස 1000ක්, ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ නිවාස 1230ක්, වැවිලි සහ ප්‍රජා යටිතල අමාත්‍යාංශය යටතේ නිවාස 3100ක් සහ පළාත් සභා නවය යටතේ නිවාස 3000ක් විදියට නිවාස තිස්දහසකට අධික සංඛ්‍යාවක් ඉදිකරන්න මේ වැඩසටහන යටතේ සැලසුම් කර තියෙනවා.

ආපදාවෙන් හානියට පත්වුණ නිවාස නැවත ඉදිකිරීමේ වැඩසටහන යටතේ නිවාස විසිදහසක් විතර ඉදිකරන්න සිදුවෙනවා.

***පසුගියදා ජනාධිපතිවරයාගේද සහභාගීත්වයෙන් උතුරේ නිවාස ව්‍යාපෘතියකට මුල්ගල් තැබුණා. උතුරේ යුද්ධය අවසන් වෙලා දැන් වසර 16ක්. යුද්ධය නිසා වාසස්ථාන අහිමි වූ ජනතාවට නිවසක් ලබාදෙන්න මෙතරම් කලක් ගතවුණේ ඇයි?***

ඒක එක්තරා ආකාරයක ඛේදවාචකයක්. යුද්ධය අවසන් වුණේ 2009 වසරේ. මේ ගෙවුණ අවුරුදු 16 තුළ, යුද්ධය නිසා අවතැන් වූ පවුල් සඳහා යම් නිවාස ප්‍රමාණයක් ඉදිකර තියෙනවා වුණාට විවිධ දේශපාලන කඹ ඇදිලි නිසා වැඩසටහන සම්පූර්ණ කරන්න බැරිවෙලා තියෙනවා. බලයේ හිටපු දේශපාලකයින්ට අඩුම තරමින් මේ යුද්ධයෙන් බැටකෑ පවුල්වලට වැටිල ඉන්න ගෙයක් හදා දෙන්න ඕනෑ කියන සහකම්පනයවත් තිබුණෙ නැද්ද කියන ප්‍රශ්නයක් පැනනගිනවා. යුද්ධය අවසන් වුණ 2009 අවුරුද්දේ ඉපදුන දරුවන්ගේ වයස අවුරුදු 16ක් වෙද්දිත් ඔවුන්ට තාමත් හරිහමන් නිවසක් නැහැ කියන එක අභාවාචක අත්දැකීමක්.

සමහර පවුල් සඳහා නිවසක් වෙනුවෙන් කලින් වෙන්කර තිබුනෙ ලක්ෂ නවයක්. සාපේක්ෂව විශාල පවුලකට රුපියල් ලක්ෂ 15ක්. නමුත් ජාතික ජන බලවේග ආණ්ඩුව එක් නිවසක් ඉදිකරගන්න රුපියල් ලක්ෂ විස්සක් ලබාදෙන්න තීරණය කළා. නිවස සම්පූර්ණ වෙන්න විදුලි, ජල සැපයුම් ආදී යටිතල පහසුකම් සියල්ල අවශ්‍යයි කියල අපි හිතනවා.

2026 වසරේ අයවැයෙන් රුපියල් මිලියන 5000ක් මේ වෙනුවෙන් වෙන් කළා. පවුල් 2500 ක් මේ යටතේ අංගසම්පූර්ණ, තමන්ගෙම තැනක් තනාගනීවි කියලයි අපේ විශ්වාසය. වසර කිහිපයක් තුළ මේ වැඩසටහන සම්පූර්ණ කර අවසන් කරන්නයි අපේ අදහස.

> **අපි පදිංචිවෙලා ඉන්න තැන තමයි අපේ ආර්ථික ජීවිතයත්, සංස්කෘතික ජීවිතයත්, සමාජ ජීවිතයත් කියන සියල්ල තිබෙන්නේ. ඒවා සඳහා පිළිතුරු සොයමින් තමයි වෙනත් තැන්වල පදිංචි කරන්න වෙන්නෙ. නමුත් ආණ්ඩුවක් ලෙසත්, රටක් ලෙසත් අපි ඔවුන් සමඟ සිටිනවාය කියන විශ්වාසය ගොඩනගාගන්න අප සමත් වී තිබෙනවා. ඒ විශ්වාසය බොහොමයක් අභියෝගවලට මුහුණ දෙන්න පහසු කරාවි.**

***ආපදා නොවූ ප්‍රදේශවල ව්‍යාපෘතිවලදී ඉඩමක් තියෙන, පවුලකට ගේ හදාගන්න ලබාදෙන මුදල රු. ලක්ෂ 10යි. වර්තමානයේ ගොඩනැගිලි ද්‍රව්‍ය මිලත් එක්ක මේ මුදල ප්‍රමාණවත් නෑ නේද?***

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක නිවාස ආධාර වැඩසටහන මඟින් තමයි මේ ලක්ෂ 10ක අධාරයක් දෙන්නෙ. මෙය නැවත අය නොකරගන්නා ආධාරයක්. මේ විදියට අඩු ආදායම් පවුල් 10,000ක් සඳහා මේ ආධාරය ලැබෙනවා. ළමා හා කාන්තා අමාත්‍යාංශය යටතේ සහ අපි කළින් කතාකරපු නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවාස ආධාරය ලක්ෂ 20ක් එක පවුලකට ලැබෙනවා.

ලක්ෂ 10 ආධාර වැඩසටහන සඳහා අපි තෝරාගන්නෙ අඩුම තරමින් නෑදෑයෙකුගේ නිවසකවත් ජීවත්වෙන්න අවස්ථාව නැති, මැටි, පොල් අතු, ලෑලි වගේ දේවල්වලින් ගෙවල් තනාගෙන ඉන්න පවුල්. කිසිදු දේශපාලන අතපෙවීමක් නොමැතිව 2025 අවුරුද්දෙ ගමේ ඉන්න නිවසක් තනාදිය යුතු මෙවැනි සුදුසුම පවුලක් තෝරාගැනීමම සමාජයේ විශාල ප්‍රසාදයකට ලක්වුණා. ලක්ෂ 10ක භාවිත කර තනා නිම කළ යුතු නිවාස සැලසුම්, තාක්ෂණික දායකත්වය සහ නිරන්තර අධීක්ෂණය නිවාස සංවර්ධන අධිකාරියේ තාක්ෂණික නිලධාරීන් මගින් සිදුකරනවා.

විශේෂත්වය තිබෙන්නෙ නිවසක් සඳහා ආධාර ලැබිය යුතුම මෙවැනි පවුල් තෝරාගත්තම බොහෝ දෙනෙක් ඔවුන්ට උදව් කරනවා. ඒ පවුලේ ශ්‍රමය ඔවුන්ගේ නෑදෑ හිතවතුන්ගේ උදව් උපකාර වගේම ගමේ අය උදව් කරනවා. මේ පවුල්වල උනන්දුව සහ ප්‍රජා දායකත්වය ඉහළින්ම ලැබුණ නිසා රුපියල් ලක්ෂ 10 භාවිත කරල ජීවත් වෙන්න පුළුවන්, අංග සම්පූර්ණ "තමන්ගෙම තැනක්" ඉදිකරගන්නවා අපි හොඳින්ම දැක්කා. ඒ නිසයි මේ අවුරුද්දේ අපි පවුල් දසදහසකට මේ ආධාරය හරහා නිවාස ඉදිකරන්න මුදල් වෙන් කළේ.

දිට්වා ආපදාවෙන් නිවාස 11 වැනි පිටුවට






# සුන්බුන් විපක්ෂයේ බංකොලොත් මතවාද...

විපක්ෂයක කාර්යභාරය වන්නේ ආණ්ඩුවේ සාධනීය දේට එකඟ වීමත්, අසාධාරණ, අයුක්ති සහගත, ප්‍රජාතන්ත්‍රවාදී නොවන, නීතියට පටහැණි දේට විරුද්ධ වෙමින් විකල්ප යෝජනා ඉදිරිපත් කිරීම හා ජනතාවගේ හඬ පාර්ලිමේන්තුවේ නියෝජනය කිරීමය. නමුත් වත්මන් විපක්ෂ නායකයාගේ හා 'විපක්ෂයේ' භූමිකාව බවට පත්ව ඇත්තේ, 'ඊනියා විරුද්ධ පක්ෂ' භූමිකාවයි. කිසිදු විද්‍යාත්මක හෝ ප්‍රතිපත්තිමය සංවාදයකින් තොරව දුටු පමණින් සියල්ලට විරුද්ධ වීමයි.

මේ නිසාම ජනතාවගේ නියෝජනයක් හෝ ජනතාවගේ හඬක් පාර්ලිමේන්තුව තුළ විපක්ෂයෙන් බලාපොරොත්තු විය නොහැක. ඒ වෙනුවට ඔවුන්ගෙන් සිදුවන්නේ ජනතාවට එරෙහි නියෝජනයකි. උදාහරණ කිහිපයකින්ම ඒ බව පසක් කළ හැකිය.

වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීමට 2026 අයවැය යෝජනා ඉදිරිපත් විය. රු.1,350 ක් වැනි දෛනික සොච්චම් වැටුපක් පමණක් හිමි වූ වතු කම්කරුවන්ගේ වැටුප රු. 400 කින් වැඩි කිරීමට වත්මන් ජනතාවාදී ආණ්ඩුව යෝජනා කළ විට, 'විරුද්ධ පක්ෂය' යුද ප්‍රකාශ කළේය. සුපුරුදු පටු හා කුහක දේශපාලන දැක්මට අනුව කිසිදු තර්කානුකූල කියවාග ැනීමකින් තොරව විරුද්ධ විය. සජබ මංත්‍රිනි රෝහිනී කවිරත්න තදියමේ ගොස් අල්ලස් හා දූෂණ චෝදනා කොමිසමට පැමිණිලිද කළාය. මේ නිසා ලංකා ඉතිහාසයේ පළමු වතාවට කම්කරුවෝ විපක්ෂයට එරෙහිව පොල් ගැසුවෝය; උද්ඝෝෂණ සිදු සිදු කළහ.

එසේම මිනිස් ජීවිත හා දේපළ විනාශ කරමින් පැමිණි දිට්වා සුළි කුණාටුවෙන් පසුත් විපක්ෂයේ හැසුරුනේ වගකිවයුතු විපක්ෂයක් ලෙස නොව 'විරුද්ධ පක්ෂයක්' ලෙසයි. සිදු වූ ව්‍යසනයෙන් රට ගොඩගන්නවා වෙනුවට, එයට සහය දෙනවා වෙනුවට, ආණ්ඩුව හා ජනතාව එක්ව සිදු කළ මහා ශ්‍රම මෙහෙයුම්වලට පවා එරෙහිව කටයුතු කිරීමය. බොරු අවලාද කියා පෑමය. ඊනියා විවේචන ඉදිරිපත් කිරීමද දක්නට ලැබුණි. කුණාටුවෙන් නිවාස අහිමි වූවන් වෙනුවෙන් ලක්ෂ පනහක් ලබාදීම ආණ්ඩුව ගත් ඓතිහාසික තීරණයට පවා, "අගරු වූ චෙක් පත් ලබා දුන් බවට" බොරු අවලාද දෙඩවීමට තරම් කුහක භාවිතයක නිරත විය.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලටද සුපුරුදු ලෙසම විරුද්ධ විය; උද්ඝෝෂණ කළේය; පොල් ගැසුවේය. අදටත් විරෝධය පළ කරමින් සිටී. බොරු අවලාද දොඩවයි. "අධ්‍යාපනය අසභ්‍යකරණය කරනවා" යැයි බියක් සමාජ ගත කිරීමටද විපක්ෂ නායකයා උත්සාහ දැරීය.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යනු, අපේ රට ගොඩනැගීමේ අඩිතාලමයි. නමුත් 'ඊනියා විරුද්ධ පක්ෂය' නටන නාඩගම, ජනතා අභිලාෂයන්ට එරෙහි වීමකි. ලබාගත් සමාජ ජයග්‍රහණය ආපසු හැරවීම වෙනුවෙන් ගන්නා නරුම උත්සාහයකි. ඒ වෙනුවෙන් ඔවුහු ව්‍යාජ මත සමාජ ගතකරමින් සිටිති. කෘත්‍රිම ලෙස ගැටුම් නිර්මාණය කරමින් සිටිති. බලය පමණක් මුදුන් පමුණුවා ගනිමින් නැවත කෙසේ හෝ බලය ලබා ගැනීමේ කෑදර උවමනාව වෙනුවෙන් කටයුතු කරමින් සිටිති.

විපක්ෂය මෙලෙස, ජනතාව ගොඩනැගූ ජනතාවාදී ආණ්ඩුවත්, ආණ්ඩුව මගින් සිදුකරන ජනතාවාදී ප්‍රතිසංස්කරණවලටත් එරෙහිව කරනු ලබන නින්දිත උත්සහයට එරෙහිව සැබෑ ජනතාවාදී මතවාදයක් ගොඩනැගීමත්, ලබාගත් දේශපාලන ජයග්‍රහණය රැකගැනීමටත්, කටයුතු කිරීම මේ මොහොතේ නිර්ධන පාංතික සමාජ ව්‍යාපාරයක මූලික කාර්යය බවට පත්විය යුතුය. ඒ වෙනුවෙන් මග පෙන්වීම, අවබෝධය ලබාදීම හා ශක්තිමත්ව සංවිධානය වීම අප කාගේත් වගකීම වන්නේය.

# ආදරවන්තයින්ගේ දිනයේ කතාව

පෙබරවාරි 14 වැනිදා ආදරවන්තයින්ගේ දිනය. ආදරවන්තයින්ට දිනයක් අවශ්‍ය නැති වුණත්, ආදරේ කරන්න එක දිනයක් අවශ්‍ය නැති වුණත්, ආදරවන්තයින්ගේ දිනය ආදරය පිළිබද කතා කරන්න එහෙම දිනයක් තියෙන එක හොඳයි.

මිලක් නැති හෙටක් ඇති ආදරයක් හොයා ගැනීම වෙනුවෙන් තමයි අපි මේ වෙහෙසෙන්නේ. ආදරවන්තයින්ගේ දිනය කියන්නේ අනෙකා පිළිබඳව ඔබට තියෙන හැඟීම පෙන්වන දවසක්. රටට ආදරේ කරන පරම්පරාව විදිහට අපි, අපි සමඟ ඉන්න සමීපතමයන්ටත් ආදරේ කරනවා. මිනිසා කියන්නේ නිරන්තරයෙන්ම ආදරය පිළිබඳව පිපාසයකින් ඉන්න කෙනෙක්. ජීවිතයේ කවදාම හෝ එකම එම වතාවක් හෝ ආදරණීය අත්දැකීමක් නොවිඳි කෙනෙක් නැතුව ඇති. අත්දැකීම් අසමාන වුණත්, හැමෝටම ආදරය ගැන අත්දැකීම් ඇති.

වැලන්ටයින් දිනයක් ඇයි සමරන්නේ කියන එකට අතීත කතාවක් තියෙනවා. ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවසේ දී පමණ ක්ලෝඩියට් සීසර් කියලා කෙනෙක් හිටියා. ඒ කාලයේදී තිබුණ යුදමය වාතාවරණයේ එක්ක හැමෝටම යුද මානසිකත්වයක් තිබුණා. රටේ යුද්ධය යන අතරේ තරුණ තරුණියෝ ආදරය කළා. විවාහවුණා. යුද්ධයට එයාලගෙන් ලැබෙන දායකත්වය අඩුයි කියලා හිතුනහම සීසර් කළේ එයාලට කසාද බඳින එක තහනම් කරපු එක. හැබැයි සීසර්ටවත් ඇමති මණ්ඩලයටවත් මේක අදාළ වුණේ නැහැ.

මේ අසාධාරණය දැකපු වැලන්ටයින් පියතුමා කිවුවා, සීසර්ට ඕන විදිහට මේක කරන්න දෙන්න බැහැ කියලා. ඒ අනුව වැලන්ටයින් පියතුමා හොරෙන් කසාද බැන්දුවා.

මේක දැනගත්තු සීසර් වැලන්ටයින් පියතුමාව මරා දැම්මා. ආදරය වෙනුවෙන් තමන්ගේ ජීවිතය පවා කැප කරපු වැලන්ටයින් පියතුමාව සමරන්න තමයි මේ දිනය වෙන්වෙලා තියෙන්නේ.

එයින් අවුරුදු ගාණක්, යුග ගාණක් ගතවෙලා තිබුණත්, අපි කාටවත් ඇත්ත ආදරය හොයාගන්න පුළුවන් වෙලා තියෙනව ද කියන ප්‍රශ්නය තියෙනවා. අපි මේ හොයාගන්න වෙහෙසෙන්නේ අන්න ඒ ඇත්ත ආදරය මොකක්ද කියන එක.

ආදරයට වගේම විවාහයට දෑවැදි, කුලමල, මිලක් අදාළ නොවන ආදරයක් ගැන කතා කරන්න ආදරවන්තයින්ගේ දිනය හේතුවක් කරගමු.

තමන්ට පිටුපා යන පෙම්වතාට, පෙම්වතියට වෛර කරනවා වෙනුවට, උපේක්ෂාවෙන් දරාග න්න පරම්පරාවක් අපට අවශ්‍යයයි. බාහිර සාධක මත තීරණය වන ආදරයක් වෙනුවට සැබෑ මානව දයාවෙන් යුතු ආදරයක් අවශ්‍යයයි. කූඩු කරලා, හිර කරන නිදහස අහුරන ආදරයක් වෙනුවට පියඹන්න ඉඩ දී සතුටු වෙන සැබෑ ආදරයක් අපට අවශ්‍යයයි.

ඒ සියල්ල අතර අපි හැමෝම කොහේ හරි තැනක සැබෑ ආදරය හොයනවා.



# "ඔබේ වැලන්ටයින් වෙතින්"...

ලේ පිපාසිත ක්ලෝඩියස්ලා
මිනිස් හදවත් ඉරාදමනා
ආදරේ නොදැනම අවි
දැරූ
නුඹලාට ලැබුණේම
වෛරයය...

අකීකරු වැලන්ටයින්..!
රතු රුහිරු හෙළන,
අවි දරන දෑතට
රතු මල්පොකුරු දුන්
වරදට
නීති පොත්වල පිටු ඉරා
පෙම්වතුන් එක් කළ පවට
ගෙල සිඳින ක්ලොඩියස්ලා
එමට..

සියලු බලයටැඩින්
අදත් ලොව වැජඹෙන
හිසින්
'ආදරණීය වැලන්ටයින්"
ලොවම රතු රෝස මල්
සුවඳින්..

සිරගෙදර අඳුරු පවුරෙන්
එපිට පෙනෙනා ලෝකයට
"ඔබේ වැලන්ටයින් වෙතින්"
හුදෙක් 'පෙම් ලිපියක්'
නොව
ක්ලෝඩියස්ලාට එදිරිව,
නිදහස පතා දිවිදුන්
"විමුක්තිකාමීන්ගේ"
අත්සන..!

## ෆින්ලන්තය වාතය මගින් විදුලිය සම්ප්‍රේෂණය කරයි!...






ෆින්ලන්තය විසින් වාතය හරහා විදුලිය සම්ප්‍රේෂණය කළ හැකි රැහැන් රහිත බලශක්ති පද්ධතියක් නිපදවා ඇත. ප්ලග් හෝ කේබල් නොමැතිව විදුලිය සම්ප්‍රේෂණය කිරීමේ මෙම සොයා ගැනීම, ලෝකය නව මානයකට යොමු කරන යෝධ පිම්මක් ලෙස සැලකිය හැක. ශතවර්ෂයකට වැඩි කාලයක් තිස්සේ විදුලිය රඳා පැවතුණේ වයර්, විදුලි ජාල සහ ලෝහමය මාර්ග මතයි. ෆින්ලන්තයේ මෙම නව ප්‍රවේශය, විදුලි සම්ප්‍රේෂකයක සිට ග්‍රාහකයක් වෙත විවෘත අවකාශය හරහා ඉතා නිවැරදිව පාලනය කරන ලද විද්‍යුත් චුම්භක ක්ෂේත්‍ර භාවිතා කරමින් ආරක්ෂිතව බලශක්තිය සම්ප්‍රේෂණය කිරීම මගින් එම පැරණි ක්‍රියාවලියට අලුත් මානයක් එක් කරමින් පවතී. මෙය අනාගතයේදී බලශක්තිය බෙදා හරින ආකාරයෙහි කැපී පෙනෙන වෙනසක් ඇති කිරීමට සමත් වී ඇත.

## කණ්නාඩිවලින් සැකසුණු ලෝකයේ ලොකුම සූර්ය තාප බලාගාරය...



චීනයේ ගෝබි කාන්තාරය පිහිටා ඇති මෙම විශාලම සූර්ය තාප බලාගාරය අක්කර ගණනාවක් පුරා සමන්විතයි. හේලියෝස්ටැට් ලෙස හඳුන්වන විශේෂ කණ්ණාඩි 12,000ක් පමණ මෙහි පිහිටා ඇත. මෙම විශේෂිත වූ යෝධ කණ්ණාඩි මගින් හිරු එළිය ලබා ගනිමින් මෙහි මධ්‍යයේ පිහිටා ඇති යෝධ කුළුණක් වෙත පරාවර්තනය කරයි. මෙම කුළුණ මගින් හිරු එළිය එක ස්ථානයකට යොමු කර එමගින් විශාල තාපයක් නිපදවන අතර එම කුළුණ තුළ ගබඩා කර ඇති දියර වර්ගයක් වන ලුණු විශේෂයක් මගින් මෙම තාපය රාත්‍රී කාලය පුරාම රඳවා ගනී. රාත්‍රී කාලයේදී මෙම තාපය මගින් වතුර වාෂ්ප කර ටර්බයින් කරකවා පැය 24 පුරාම විදුලිය නිපදවීම සිදු කරයි. මෙමගින් ටොන් දහසක පමණ කාබන්ඩයොක්සයිඩ් අඩංගු වායු පරිසරයට එක්වීම වළක්වමින් දේශගුණික විපර්යාස සඳහා තිරසාර විසඳුමක් ලෙස ඉදිරි අනාගතයේ විශාල පෙරළියක් සිදුකිරීමට මෙම ක්‍රියාවලිය ඉවහල් වේ.

## මිය යමින් පවතින ඇමසන් වැසි වනාන්තරය...



බර්ක්ලි හි කැලිෆෝනියා විශ්වවිද්‍යාලය මෙහෙයවූ අධ්‍යයනයකින් ඇමසන් වනාන්තරය "Hypertropics" හෙවත් අති-නිවර්තන ලෙස හැඳින්වෙන නව දේශගුණික විපර්යාසයකට යොමු වෙමින් පවතින බව හෙළි කර ඇත.


මෙම සංක්‍රාන්තියට මූලිකවම බලපා ඇත්තේ පෙර නොවූ විරූ මට්ටමේ "උණුසුම් නියඟ" (Hot droughts) තත්වයන්ය. එනම්, ඉතා අධික තාපය සහ දරුණු ජල හිඟය එකවර ඇතිවීමෙන් මෙය බලපායි. මෙම ක්‍රියාවලිය පෘථිවියේ කාබන් අවශෝෂණය කර ගන්නා ප්‍රධානතම මූලාශ්‍රයක් වන ඇමසන් වනාන්තරයට දැඩි තර්ජනයක් එල්ල වී ඇත.

මෙම අතිශය දරුණු දේශගුණික තත්ත්වයන් හේතුවෙන් වනාන්තරයේ ගස් මියයාමේ ප්‍රතිශතය 55% කින් ඉහළ ගොස් ඇති බව පර්යේෂකයෝ පෙන්වා ඇත. පසෙහි තෙතමනය අඩුවන විට, කාබන් ලබා ගැනීමට නොහැකි වීමෙන් ආහාර නිපදවා ගත නොහැකි වීමත්, ජලය ගෙනයන නාල පද්ධතියේ වායු බුබුළු ඇතිවීම (මිනිසුන්ට ඇතිවන ආඝාත තත්ත්වයක් වැනි), එමගින් ජල සංසරණය අවහිර වීමත් හේතුවෙන් ගස් මිය යාමට බලපා ඇත.

# අවලාද, අපහාස හා
# වල්වැදුණු විපක්ෂය

ලංකාවේ දේශපාලනය තුළ වත්මන් ආණ්ඩුව සම්බන්ධයෙන් විපක්ෂයේ විවේචන දෙස බලනවිට පෙනීයන ප්‍රධානම කරුණ වන්නේ ඔවුන් අරමුණක් ප්‍රතිපත්තියක් නැතිව වල්මත්ව ඇති බවකි. පාර්ලිමේන්තුවේ නිල විපක්ෂයත් ඊටම අත්වැල් අල්ලන පාර්ලිමේන්තුවෙන් පිටත ආණ්ඩු විරෝධීනුත් එක පෙරමුණක සිට පසුගිය කාලය පුරාම සිදු කර තිබෙන්නේ ආණ්ඩුවට ප්‍රබල දේශපාලන විවේචන එල්ල කිරීම වෙනුවට අපහාස, අවලාද නැගීමය. පුද්ගලයින්ට නින්දා කිරීමය. මෙය පසුගිය මැතිවරණ කාලය පුරාම පැවති අතර මේ වනවිට තත්වය තවත් බරපතළ වී ආණ්ඩුවට ප්‍රතිපත්තිමය, දෙශපාලනමය විවේචනයක් එල්ල කර ගැනීමට නොහැකි තරමට විපක්ෂය පිරිහී තිබේ. බලය සඳහා, ජනතාව හා විවිධ බලවේග සංවිධානය කිරීම අරමුණු කර ගනිමින්, ප්‍රතිපත්තියක්, ඉලක්කයක් ඇතිව වැඩ කරන්නේ නම් සැබැවින්ම විපක්ෂය කළ යුත්තේ කුමක්ද? ඒ ආණ්ඩුවටත් වඩා තමන් ඉදිරියෙන් සිටින බව පෙනෙනසේ ආණ්ඩුව පිළිබඳ සාධාරණ, සාධනීය හා දේශපාලන විවේචන ඉදිරිපත් කරමින් සංයමයක්, විනයක්, සදාචාරයක් සහිතව කටයුතු කිරීමය. ආණ්ඩුවටත් වඩා තමන් ශිෂ්ට බවත් නූතන ලෝකය සමග, නවීන මතවාදයන් සමග තමන් කටයුතු කරන බවත් පෙන්වීමය. එහෙත් සිදුවෙමින් තිබෙන්නේ මුළුමනින්ම එහි අනෙක් පැත්තය. විපක්ෂය තම ග්‍රාම්‍ය, අතාර්කික, අසභ්‍ය විවේචනවල ගිලී ආපස්සට ගමන් කරමින් සිටී. එය ආණ්ඩුවේ පැත්තෙන් ආණ්ඩුවට වාසියක් මිස අවාසියක් නොවේ.

ආණ්ඩුවේ කටයුතු පිළිබඳවත්, ආණ්ඩුවේ නායක නායිකාවන් පිළිබඳවත් මෑත කාලයේ විපක්ෂයේ සියලු විවේචන ඉලක්ක වී තිබෙන්නේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාමාර්ගවල වැරදි පෙන්වාදීමට (තිබේනම්) නොව පුද්ගලයන්ට අපහාස හා අවමන් කිරීමටය. විපක්ෂයේ බොහෝ දෙනාගේ ප්‍රකාශ හා හැසිරීම් දෙස බලනවිට ඔවුන් විශාල ලිංගික අසහනයන්ගෙන් පෙළෙන අය බව පැහැදිලි වේ. විශේෂයෙන්ම දැන් කලක සිට ඔවුන් මාලිමාවේ මන්ත්‍රීවරියන්ට අසත්‍ය ලිංගික කරුණු පටබඳිමින් අපහාස කිරීම මෝස්තරයක් කරගෙන තිබේ. විවාහ නොවීම, දරුවන් නැතිකම වැනි සභ්‍ය සමාජයේ කථා නොකරන දේවලින් දමා ගසමින් විකෘති වින්දනයක් ලැබීමට විපක්ෂයේ බොහෝ දෙනා පෙළඹී සිටිති. ඔවුන්ගේ ජීවිතවල ඇති අර්බුද හා කඩාවැටීම් අන් අයට ආරෝපණය කිරීම හැර අන් යමක් ඔවුන් නොදන්නා බව පෙනේ.



මෑතකදී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා විපක්ෂය ගෙනගිය මහා සෝෂාව දෙස බලන්න. අධ්‍යාපනය පිළිබඳ නව අධ්‍යාපන ක්‍රමවේදයන් පිළිබඳ, ඒවායේ ඇත්ත අඩුපාඩු පිළිබඳ, කිසිවක් ඔවුන්ගේ විවේචනවල නොවීය. ඔවුන් රසකරමින් කථා කළේ 06 ශ්‍රේණියේ ඉංග්‍රීසි මොඩියුලයේ සඳහන්ව තිබූ, ආණ්ඩුව වහාම මැදිහත්ව ඉවත් කළ අසභ්‍ය වෙබ් අඩවිය පිළිබඳවය. ඒ අනුව මුළු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හා එහි සමස්ත අඩංගුවම "අසභ්‍යකරණයට" ලක්කළ ඔවුන් පෙන්නුම් කළේ ඔවුන් කොතරම් "කුණුහරුප කථා කිරීමට" කැමැතිද යන්නය; කුණු රසයට කැමතිද යන්නය. සමාජයක ප්‍රසිද්ධියේ කිසිවිටකු කථා නොකරන ඉතාම ග්‍රාම්‍ය හා පහත් අසභ්‍ය වදන්වලින් අගමැතිවරියට අපහාස කිරීමට ඔවුන් එකිනෙකා හා තරග වදිනු දැකගත හැකි විය. ඒ සඳහා ඔවුහු බොරු තොගයක්ද ඇදබෑවෝය. ගෙදර ගොස් තම බිරිඳගේ, තම දියණියගේ මුහුණ බලා කථා කිරීමට බැරි තරමේ අසභ්‍ය කථා තොගයක් ඔවුහු රසකරමින් ප්‍රසිද්ධියේ කථා කළෝය. ඉන් ඔවුන් පෙන්වූයේ අන් කිසිවක් නොව තමන් කවුද යන්නය.

ආණ්ඩුවේ ප්‍රධානීන්ට මෙවැනි කිසිදු පදනමක් නැති ලිංගිකමය චෝදනා එල්ලකරමින් ඉන් ස්වයං තෘප්තියක් ලබන තරමට මොවුන් මානසික රෝගීන් බවට පත්ව සිටි ආකාරය දැන් දැකගත හැක. පැරණි ගෝත්‍රික සමාජවල දී පවා නොතිබුණු, අපේ රටේම බව සියවස් දෙක තුනකට කලින් දක්නට නොවුණු තරමේ ග්‍රාම්‍ය චින්තනයක මොවුහු ගිලී සිටිති. එවැනි තලේබාන් වර්ගයේ පිරිසක් අතට යළි බලය ගියහොත් සිදුවිය හැකි විනාශය සමාජය දැන් සිටම තේරුම් ගැනීම වැදගත්ය.

ලෝකය ගමන් කරන්නේ ඉදිරියටය. අලුත් පරපුරත් සමග නව සංකල්ප, වටහාගැනීම් හා වඩාත් මානවාදී හා ප්‍රගතිශීලී දෘෂ්ටිවාදයත් සමග, සියලු මිනිසුන්ගේ අයිතීන්ට ගරුකරන චින්තනයක් සහිතව ලෝකය ඉදිරියට ගමන් කිරීම යථාර්ථය වේ. එය ආපසු හැරවීම හා මූලධර්මවාදය වෙත රැගෙනයාම දැන් කිසිවකුට කළ නොහැක. එහෙත් විපක්ෂයේ විවිධ අය මේ උත්සාහ කරන්නේ එයටය. ඒ නිසාම එය පැරදවිය යුතුය. සමාජය තුළ වඩා හොඳ උසස් සංවාදයක් සඳහා අනාගතය නියෝජනය කරන අය පෙරමුණ ගත යුතුය. අවලාද අපහාස, බොරු හා ඒ වෙනුවට සාධනීය සංවාදයක් සාකච්ඡාවක් නිර්මාණය විය යුතුය.


> **ලෝකය ගමන් කරන්නේ ඉදිරියටය. අලුත් පරපුරත් සමග නව සංකල්ප, වටහාගැනීම් හා වඩාත් මානවාදී හා ප්‍රගතිශීලී දෘෂ්ටිවාදයත් සමග, සියලු මිනිසුන්ගේ අයිතීන්ට ගරුකරන චින්තනයක් සහිතව ලෝකය ඉදිරියට ගමන් කිරීම යථාර්ථය වේ. එය ආපසු හැරවීම හා මූලධර්මවාදය වෙත රැගෙනයාම දැන් කිසිවකුට කළ නොහැක. එහෙත් විපක්ෂයේ විවිධ අය මේ උත්සාහ කරන්නේ එයටය.**

විවේචන වෙනුවට අවලාද අපහාස, නැගීම හා සත්‍යය විකෘති කොට සමාජගත කිරීම කෙනෙකුගේ දක්ෂතාවයේ ලකුණක් නොවේ. එය නොදන්නාකමේ, දේශපාලන දුප්පත්කමේ ලකුණකි. 1971 අරගලයෙන් පසු සිරගතව සිටියදී පක්ෂය තුළ මතුව තිබූ තත්වයන් පැහැදිලි කරමින් රෝහණ විජේවීර සහෝදරයා ලියූ ලිපියක (අත්දැකීම් කිහිපයක්) මෙසේ සඳහන් කර තිබේ.

"අවලාද, නින්දා, අපහාස, කරුණු විකෘති කිරීම් සහ බොරු බේගල් ඇදබෑම් කවුරු කරතත්, එය කරන්නවුන්ගේ දක්ෂතාවය, කුසලතාවය, නිවැරදිභාවය, ශක්තිමත්භාවය හා විද්‍යාත්මක බව නොමැති බව ප්‍රදර්ශනය කරයි. අවලාද, අපහාස හා බේගල් මිනිසුන්ගේ ශක්තිය නොව දුබලතාවයත්, සත්‍යය නොව බොරුවත්, නිවැරදිභාවය නොව සාවද්‍යභාවයත් සැමවිටම ප්‍රදර්ශනය කරයි. ඒවා මිනිසුන්ගේ දේශපාලන බංකොලොත්භාවයේ, පරාගත වීමේ සහ පරාජයේ සංකේතයෝය. එබැවින් මාක්ස් - ලෙනින්වාදීහු ඒවා කිසිකලෙකත් සිය අවි ආයුධ ලෙස පාවිච්චි නොකරති" ප්‍රතිපත්තියක් නැති, දැක්මක් නැති, වල්මත් වූ දේශපාලනයකදී සැමවිටම "අවි" ලෙස අපහාස, අවලාද තෝරාගැනීම හා අවමන් කිරීම දැකිය හැක. අවමන් කිරීම දුබලකමේ ලකුණක් වන්නා සේම අවමාන දරාගැනීමට නොහැකිව ඉන් සසලවීමද දුබලකමේ ලකුණක් වේ. විශේෂයෙන්ම දේශපාලනයේදී ඒවා තේරුම් ගැනීමට මෙන්ම දරාගනීමටද අයෙක් සමත් විය යුතුය. 'මගේ ජීවිතය' නම් කෘතියේ ෆිදෙල් කස්ත්‍රෝ සහෝදරයා පවසා තිබූ අදහස් කිහිපයකින් මේ ලිපිය නිමාකරමු. ෆිදෙල් මෙසේ පවසා තිබුණි.

"ඔබ ප්‍රතිපත්තිගරුක විය යුතුයි. ජනතාව සඳහා මෙන්ම ඔබේ සතුරන් සඳහාද ප්‍රතිපත්ති තිබිය යුතුයි. නැති නම් ඔබට ජයගත නොහැකියි."


"ඔබ සතුරාගේ ගෞරවයට පාත්‍ර විය යුතුයි. සතුරාට තදින් පහරදිය යුතුයි. ඒත් අවමන් නොකළ යුතුයි" ඒ ෆිදෙල්ගේ අදහසය. එහෙත් අපේ රටේ විපක්ෂයට එවැනි දැනුමක් අධ්‍යාපනයක් නැත. ඒ නිසාම වත්මන් විපක්ෂයට අවලාද මඩගොහොරුවේම ලගිනවා හැර අන් දේශපාලන ගමනක්ද නැත.



"දයලෙක්තික දර්ශනයට කිසිවක් නිත්‍ය, සර්ව සම්පූර්ණ හෝ ශුද්ධ හෝ නොවේ. එය සෑම දෙයක්ම හා සෑම දෙයකම තාවකාලික බව අනාවරණය කරයි. ඇති වීමේ හා නැති වීමේ, පහළ සිට ඉහළට වන අනන්ත උද්ගමනයේ ක්‍රියාදාමය හැර වෙනත් කිසිවක් එය හමුවේ ඔරොත්තුදීමට අසමත්ය."

**ලෙනින්,**

**තෝරාගත් කෘති,**
**01වෙළුම,**
**18,19 පිටු**




# ග්‍රීන්ලන්තය ලෝක බල පොරයට මැදිව

ග්‍රීන්ලන්තය තම රට සමග ඈඳාගැනීමට සූදානම් බව එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් නැවත ප්‍රකාශ කිරීමත් සමග ඩෙන්මාර්කය එම ප්‍රකාශය හෙළා දකිමින් ප්‍රතිචාර දක්වා තිබිණි. යුරෝපා සංගමය සමග මෙන්ම යුරෝපා සංගමයේ සාමාජික රටවල් සමග එක්සත් ජනපදය විසින් පසුගිය වකවානුවේ ඇතිකරගත් යම් යම් මතභේදාත්මක සිදුවීම් අතර ප්‍රමුඛස්ථානයක් අද වන විට මෙම ග්‍රීන්ලන්ත ගැටලුවට ලැබී තිබේ.

ග්‍රීන්ලන්තය තම රටට ඈඳාගැනීමට සුදුසු බව ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා මීට පෙරද ප්‍රකාශ කර තිබිණි. ඒ ඔහුගේ පළමු ජනාධිපති ධූරකාලය තුළ 2019 වසරේදීය. ඉන්පසුව පසුගිය ජනාධිපතිවරණ සමයේ ඔහුට සහයදුන් මැතිවරණ වේදිකා තුළ පවා මෙම අදහස් ඉස්මතු වන ප්‍රකාශ කිහිප දෙනෙකු විසින්ම සිදුකර තිබිණි.

එක්සත් ජනපදය විසින් ග්‍රීන්ලන්තය තමන්ට ඈඳාගැනීම පිළිබඳව පළමුවරට කතාකරන්නේ 1867දීය. 1867 මාර්තු 30 දින එක්සත් ජනපදය විසින් ඇලස්කාව ඇ. ඩොලර් මිලියන 7.2කට (අක්කරයක් ශත 2 බැගින්) රුසියාවෙන් මිලදී ගැනීමත් සමග ග්‍රීන්ලන්තය මිලදී ගැනීම පිළිබඳව ද සාකච්ඡාවට ලක්විය. එහිදී එවකට එක්සත් ජනපද රාජ්‍ය ලේකම් විලියම් සීවර්ඩ් විසින් ග්‍රීන්ලන්තය මෙන්ම අයිස්ලන්තයත් මිලදී ගැනීමට ඩෙන්මාර්කය සමග රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡා සූදානම් කළද ඩෙන්මාර්කය විසින් එය නොසලකාහැර තිබිණි. නැවත මෙම සාකච්ඡාව මතුවන්නේ දෙවන ලෝක යුද්ධයෙන් පසු එක්සත් ජනපද ජනාධිපති හැරී ට්‍රෲමන්ගේ පාලන කාලයේදීය. එහිදී එක්සත් ජනපදය විසින් ග්‍රීන්ලන්තය මිලදී ගැනීම වෙනුවෙන් ඩොලර් මිලියන 100ක් ලබාදීමට සූදානම් වුවද එම අවස්ථාවේදීද ඩෙන්මාර්කය එය ප්‍රතික්ෂප කර තිබිණි. කෙසේ නමුත් මෙම අවස්ථා දෙකම රාජ්‍යතාන්ත්‍රික ප්‍රවේශයන් වූ නමුත් එක්සත් ජනපද වතමන් ජනාධිපතිවරයා ග්‍රීන්ලන්තය ඈඳාගැනීම සම්බන්ධයෙන් එවැනි රාජ්‍යතාන්ත්‍රික ප්‍රවේශයක් මෙතෙක් සිදුකර නොමැත. ඔහු සහ ඔහුගේ පාක්ෂිකයන් සහ අනුගාමීන් මේ මොහොතේ සිදුකරන ප්‍රකාශ පවා හුදෙක් පුද්ගලික අදහස් වන අතර නිල ප්‍රකාශ නොවේ.

ග්‍රීන්ලන්තය යනු මේ වන විට ඩෙන්මාර්කයට අයත් ස්වයංපාලිත ප්‍රදේශයකි. වර්ග කිලෝමීටර් 2,166,086 වන ග්‍රීන්ලන්ත භූමිය ඩෙන්මාර්ක් රාජධානියට අයත් භූමින් 3 අතුරින් විශාලතම භූමියද වේ. නමුත් ග්‍රීන්ලන්තයේ වත්මන් ජනගහනය 57,000ක් පමණ වන අතර ඉන් 89.5% ග්‍රීන්ලන්ත ජාතිකයෝද, 7.5%ක් ඩෙන්මාර්ක් ජාතිකයෝද වෙති. එමෙන්ම දළ ජාතික නිෂ්පාදිතය එ.ජ. ඩොලර් බිලියන 4.5ක් පමණ වන අතර ඒක පුද්ගල ආදායම එ.ජ. ඩොලර් 79,000ට ආසන්න අගයක් ගනී.

ග්‍රීන්ලන්තය ප්‍රථමවරට ජනාවාසකරණය වන්නට ඇත්තේ ක්‍රි.පූර්ව 2500දී පමණ බවට විශ්වාස කෙරේ. ඒ ඇස්කිමෝවරු විශේෂයක් වන සකාක්වරුන් විසිනි. පසුව ක්‍රි.ව. 10 වන සියවසේදී පමණ වයිකිංවරුන් විසින් ග්‍රීන්ලන්තය ජනාවාස කරන ලදී. ඒ අනුව 1261 දී ග්‍රීන්ලන්තය නෝර්වේ රාජධානියට අයත්විය. 1380දී 2වන ඕලාෆ් රජු ඩෙන්මාර්කය සහ නෝර්වේ රටවල් දෙකෙහිම පාලකයා වූ නිසා එක් ධජයක් යටතේ එක්වූ අතර ග්‍රීන්ලන්තයද එයට අයත් විය. (නෝර්වේ පාතකයා වූ 6වන හාකෝන් රජු 1380දී මිය යනවිට ඔහුගේ පුත් 2වන ඕලාෆ් ඩෙන්මාර්කයේ පාලකයා විය. පිය උරුමය අනුව ඔහුට නෝර්වේහි ඔටුන්නද හිමි විය.) වසර සිය ගණනක් මෙම රටවල් දෙක එක්ව පැවතියද 1814දී නෝර්වේ ස්වීඩනයට යටත්වීමත් සමග එය අවසන් විය. එහිදී ස්වීඩනය විසින් නෝර්වේ තමන්ට ඈඳා ගනු ලැබූ අතර ග්‍රීන්ලන්තය ඩෙන්මාර්කය යටතේ ඉතිරිවිය.

1905 දී නෝර්වේ නැවත ස්වාධීන රාජ්‍යක් ලෙස ස්වීඩනයෙන් නිදහස ලබාගැනීමෙන් පසුව 1930 දශකයේදී ග්‍රීන්ලන්තයේ සමහර භූමි ප්‍රදේශ තමන්ට අයිති විය යුතු බවට ඉල්ලා සිටින ලදී. ඒ අනුව මෙය පසිඳලීම ජාත්‍යන්තර යුක්ති අධිකරණයෙන් ඉල්ලා සිටි අතර 1933දී එහි තීරණය ප්‍රකාශයට පත්වූයේ ග්‍රීන්ලන්තයේ නීත්‍යානුකූල අයිතිය හිමිවිය යුත්තේ ඩෙන්මාර්කයට බවට තීන්දු කරමිනි. එදා සිට අද දක්වා ග්‍රීන්ලන්තය ඩෙන්මාර්කයට අයත් විය.

1933 සිට 1953 දක්වා ඩෙන්මාර්කයේ යටත්විජිතයක්ව පැවති ග්‍රීන්ලන්තය 1953 ඩෙන්මාර්කයේ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අනුව, එතැන් සිට ඩෙන්මාර්ක් භූමියක් බවට පත්විය. ඒ අනුව එතැන් පටන් ග්‍රීන්ලන්ත ජාතිකයින් ඩෙන්මාර්ක් ජාතිකයින් ලෙස පුරවැසිභාවය ලැබීය. ඔවුනට ජනතා ඡන්දයෙන් තේරීපත්ව ඩෙන්මාර්ක් පාර්ලිමේන්තුව නියෝජනය කිරීමේ හැකියාව ලැබිණි. එදා සිට අද දක්වා ම ග්‍රීන්ලන්තයේ ජනතා නියෝජිතයින් දෙදෙනෙක් ඩෙන්මාර්ක් පාර්ලිමේන්තුව නියෝජනය කරයි. නමුත් ග්‍රීන්ලන්ත ජනතාව ස්වයං නිර්ණ අයිතිය ඉල්ලා සිටීමත් සමග 1979 ජනවාරි 17 දින ජනමත විචාරණයක් ජයග්‍රහණය කිරීම මගින් ඔවුනට තමන්ගේම පාර්ලිමේන්තුවක් පිහිටුවාගැනීමේ හැකියාව ලැබිණි. ඒ අනුව අධ්‍යාපන, සෞඛ්‍ය, ධීවර වැනි විෂයන් ප්‍රාදේශීය ආණ්ඩුව යටතට පැවරිණි. නැවත 2008 සම්මත වී 2009 ජුනි 21 සිට ක්‍රියාත්මක වූ 'ග්‍රීන්ලන්ත ස්වආණ්ඩු' පනත මගින් ග්‍රීන්ලන්තය ඩෙන්මාකය යටතේ පවතින ස්වයංපාලිත රාජ්‍යයක් බවට පත්විය. මූල්‍ය, ආරක්ෂක, විදේශ කටයුතු ආදී බලතල තවදුරටත් ඩෙන්මාකය සතුවිය.

ග්‍රීන්ලන්තයේ හිමිකාරීත්වය ජාත්‍යන්තර දේශපාලනයේ දී වැදගත්වන්නේ එය ලෝක සිතියමේ පිහිටා ඇති ස්ථානයේ වැදගත්කම නිසාය. ද්විමාන සිතියමක උ. ඇමරිකාව සහ යුරෝපය දුරින් නිරීක්ෂණය වූවත් සැබෑ ත්‍රිමාන ලෝකයේ එම මහද්වීප දෙක එක්වන්නේ ග්‍රීන්ලන්තය ආශ්‍රිතවයි. එම නිසා විශේෂයෙන් ආක්ටික් කලාපයේ යුදමය ක්‍රියාකාරීත්වයන් සඳහා ග්‍රීන්ලන්ත භූමිය සහ එයට අයත් මුහුදු සීමා අතිශය වැදගත්කමක් උසුලයි. එමෙන්ම ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමත් සමග ආක්ටික් කලාපයේ අයිස් දියවීම නිසා නව නාවික ගමන්මාර්ග ග්‍රීන්ලන්තය අවටින් නිර්මාණය වී තිබේ. එමෙන්ම ග්‍රීන්ලන්තය යනු තඹ, රන්, යකඩ, යුරේනියම් ආදී සම්පත් බහුල භූමියකි. එමෙන්ම ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම සමග මුහුදු මට්ටම ඉහළ යාම වැනි පර්යේෂණ ජාතයන්තර මට්ටමින් සිදුකෙරෙන්නේද ග්‍රීන්ලන්තය ආශ්‍රිතවය. එය පාරිසරික මෙන්ම දේශපාලන වශයෙන්ද වැදගත් වේ.

ග්‍රීන්ලන්තය තුළ මේ වන විටද එක්සත් ජනපද හමුදා කඳවුරක් පවත්වාගෙන යමින් තිබේ. සීතල යුද සමයේ සෝවියට් කඳවුරට එරෙහිව මෙම කඳවුර ආරම්භ කර ඇත. කලකට ඉහත 'තුලේ' ගුවන් හමුදා කඳවුර ලෙස පැවති මෙය වර්තමානයේ 'පිටුෆික්' අභ්‍යවකාශ කඳවුර ලෙස ක්‍රියාත්මක වේ. මිසයිල අනතුරු ඇඟවීම් මෙන්ම මිසයිල ආරක්ෂක පද්ධති මෙන්ම අභ්‍යවකාශ ආරක්ෂක කටයුතු ආදී දේ ඒ මගින් නිරීක්ෂණය කෙරේ.

මීට අමතරව දෙවන ලෝක යුද සමයේ ඩෙන්මාර්කයේ එකඟතාවය සහිතව එක්සත් ජනපද හමුදා ග්‍රීන්ලන්තය තුළ රැඳී සිට තිබුණි. එමෙන්ම දීර්ඝ කාලීන යුද මැදිහත්වීම් සඳහා මෙන්ම යුද කඳවුරු සඳහා දෙපාර්ශවයේ එක්ගත්වය පළකරමින් 1951 එක්සත් ජනපදය සහ ඩෙන්මාර්කය අතර ආරක්ෂක ගිවිසුමක්ද අත්සන් කර ඇත. එසේම 1950-60 කාලයේ ග්‍රීන්ලන්තයේ අයිස් තුළ න්‍යෂ්ටික මිසයිල සඟවා තිබූ බවට ද මත පළ වී ඇත.

කෙසේ නමුත් ග්‍රීන්ලන්තය මිලදී ගැනීමට තමන් සූදානම් බවට එක්සත් ජනපද ජනාධිපතිවරයා කළ ප්‍රකාශ සම්බන්ධයෙන් මේ වන විට රටවල් ගණනාවක අවධානය යොමුව තිබේ. ඒ අරමුණ වෙනුවෙන් සීඅයිඒ නියෝජිතයින් පිරිසක් ග්‍රීන්ලන්තය තුළ රහසිගත මෙහෙයුමක් ක්‍රියාත්මක කරමින් සිටින බව පවසන ඩෙන්මාර්කය, එය දැඩිව විවේචනය කර තිබේ. එසේම ජාත්‍යන්තර නීතියට ගරුකරන ලෙසත්, දෙරට අතර අන්‍යෝන්‍ය අවබෝධය පළුදුවන ආකාරයට කටයුතු නොකරන ලෙසත් ඔවුන් වැඩිදුරටත් ඉල්ලා තිබේ.

යුරෝපා සංගමයද එක්සත් ජනපද නායකයින්ගේ ප්‍රකාශ දැඩිව හෙළාදැක තිබේ. එක්සත් ජනපදය ජාත්‍යන්තර නීතියට අභියෝග කරමින් ඇති බව පවසන ඔවුන් ඩෙන්මාකයට සහ ග්‍රීන්ලනතයට සහය පළකරන ලෙස එක්සත් ජාතීන්ගෙන් ඉල්ලා තිබේ. නෝර්වේ, ස්වීඩනය, ෆින්ලන්තය, නෙදර්ලන්තය, ජර්මනිය, එක්සත් රාජධානිය ආදී රටවල් ගණනක නායකයින්ද එක්සත් ජනපදයේ ප්‍රකාශ ග්‍රීන්ලන්තයේ ස්වෛරීත්වයට අභියෝග කර ඇති බව පවසා ඇත. ට්‍රම්ප් ජනපතිවරයාගේ ප්‍රකාශය, යුරෝපයට ආරක්ෂාව සහ සහයෝගිතාව වෙනුවෙන් ශක්තිමත්ව එකට එක්විය යුතු බවට වන දැනුම්දීමක් ලෙස බාරගත යුතු බව නෙදර්ලන්තය විසින් වැඩිදුරටත් පවසා ඇත. මේ සම්බන්ධව අදහස් දක්වමින්, ආක්ටික් කලාපය සහයෝගිතාවය සහ සාමය සහිත කලාපයක් ලෙස පවත්වාගෙන යා යුතු බව රුසියාව පවසා තිබේ.

බහුධ්‍රැවීය ලෝකය තුළ බලය වෙනුවෙන් බල කේන්ද්‍ර අතර සිදුවන ගැටුමේ තවත් එක් නිමිත්තක් ලෙස අද ග්‍රීන්ලන්තයේ හිමිකාරීත්වය පිළිබඳ අරගලය පෙරට පැමිණ ඇත.

## එක්සත් ජනපදය : දැඩි සංක්‍රමණික නීතිවලට එරෙහි විරෝධතා




එක්සත් ජනපද ජනාධිපත් ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ දෙවන ධූරකාලය ආරම්භ වීමත් සමග සංක්‍රමණිකයන්ට එරෙහි නීති දැඩි කරන ලදී. ඒ අනුව අත්අඩංගුවට ගැනීම්, සිරගත කිරීම් මෙන්ම පහරදීම් සහ ඝාතනද ඉහළ ගොස් ඇතැයි චෝදනා එල්ලවෙමින් තිබේ.

ජනවාරි 7දා මිනාපොලිස්හිදී රෙනේ නිකොල් ඝාතනය සමග ජනතා උද්ඝෝෂණ උත්සන්න වූ අතර එම නගරයේදීම ජනවාරි 24 දා ඇලෙක්ස් ජෙෆ්රි ඝාතනය සමග එය තවදුරටත් වර්ධනය විය. ඒ අනුව ජනවාරි 30 සමස්ත මහා වැඩවර්ජනයක් ද කැඳවා තිබිණි. 'No Work, No School, No Shopping' එම විරෝධතාවල ප්‍රධාන සටන්පාඨය විය.

## උගන්ඩාව : මැතිවරණ ප්‍රතිඵලයට එරෙහි විරෝධතා



පසුගිය ජනවාරි 14 දින පැවති මැතිවරණය ජයග්‍රහණය කරමින් නැවත වරක් උගන්ඩා ජනාධිපතිවරයා ලෙස යොවෙරි මුසෙවෙනි පත්වී ඇත. ඒ, 71.65%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමිනි. 1986 පටන් වසර 40ක් මුළුල්ලේ අඛණ්ඩව ඔහු එරට ජනාධිපතිධූරය හොබවයි.

මෙවර මැතිවරණ ප්‍රතිඵලයට එරෙහිව, ප්‍රතිඵලය දූෂිත යැයි චෝදනා කරමින් ජනවාරි 16 පටන් රට පුරා උද්ඝෝෂණ පැන නැගී ඇත. එයට ප්‍රධාන වශයෙන් නායකත්වය දෙනු ලබන්නේ මැතිවරණ ප්‍රතිඵලය අනුව දෙවන ස්ථානය හිමිකරගත් බොබී වයින් වේ. විරෝධතාකරුවන් ජනාධිපතිවරයාට ඉල්ලා අස්වන ලෙස බලකරමින් සිටින අතර ආණ්ඩුව විරෝධතාකරුවන් ගණනාවක් අත්අඩංගුවට ගෙන ඇත.

## මියන්මාරය : 2021 හමුදා කුමන්ත්‍රණයෙන් පසු මහමැතිවරණයක්



2021දී හමුදා කුමන්ත්‍රණයක් මගින් අවුන් සාන් සුකී බලයෙන් පලවාහැරීමෙන් පසු ප්‍රථමවරට මියන්මාරයේ මහමැතිවරණයක් පවත්වා තිබේ. හමුදා පාලනය විසින් 2023 වසරේ මැතිවරණයක් පවත්වන බවට පොරොන්දු දී තිබුණද එය දිනෙන් දින කල්දමන ලදී.

කෙසේ නමුත් මැතිවරණයෙන් බහුතර ආසන සංඛ්‍යාවක් දිනාගැනීමට හැකිව ඇත්තේ පැවති මිලිටරි පාලනයේ සහය සහිතව ඉදිරිපත් වූ එක්සත් සහයෝගිතා සහ සංවර්ධන පක්ෂයටය. එමෙන්ම එරට 2008 ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීධූරවලින් 25%ක් හමුදා මගින් පත්විය යුතුව ඇත. 2020 මැතිවරණයේදී තේරීපත්වූ ආසනවලින් 90%ක් හිමි දේශපාලන පක්ෂ මෙවර මැතිවරණය තුළ දක්නට නොලැබිණි.

## වියට්නාමය : කොමියුනිස්ට් පක්ෂයේ 14වන සමුළුව සාර්ථකව අවසන්




වියට්නාම් කොමියුනිස්ට් පක්ෂයේ 14වන සමුළුව ජනවාරි 19 සිට 23 දක්වා හැනෝයි අගනුවරදී පවත්වන ලදී. රට පුරා පිහිටි පක්ෂ සංවිධාන නියෝජනය කරමින් නියෝජිතයෝ 1586ක් පමණ මෙම අවස්ථාවට සහභාගී වී සිටියහ.

එහිදී පක්ෂ ප්‍රධාන ලේකම් ලෙස ටෝ ලාම් සහෝදරයා නැවතත් තේරීපත්විය. ඉදිරි වසර 05 සඳහා ආර්ථික වර්ධන වේගය 10% මට්ටමේ පවත්වාගැනීම ඇතුළු එරට ජාතික සංවර්ධන ඉලක්ක පිළිබඳව මෙහිදී යෝජනා සම්මත වී ඇත. නවෝත්පාදන, ඩිජිටල්කරණය, පරිසර හිතකාමීත්වය එම සංවර්ධන යෝජනා තුළ අන්තර්ගතව තිබිණි. 'සංවිධානය - ප්‍රජාතන්ත්‍රවාදය - විනය - ඉදිරිගමන - සංවර්ධනය' මෙවර සමුළුවේ තේමාපාඨය විය.

# 2028 දී ණය ගෙවිය හැකිද?



ශ්‍රී ලංකාව දශක ගණනක සිට මුහුණ දුන් ධනේශ්වර ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස 2022 වන විට ආර්ථිකය කඩාවැටී ජාත්‍යන්තරය ඉදිරියේ බංකොලොත් රටක් බවට පත්වූයේ ඒ වනවිට ගෙවිය යුතුව තිබූ විදේශ ණය ගෙවා ගැනීමට නොහැකි වූ නිසාය. එතැන් පටන් අප මුහුණදුන් දරුණු අර්බුදය වූයේ ඩොලර් සංචිත නොමැති වීමත් එම නිසාම අත්‍යවශ්‍ය ආනයන සහ ගෙවිය යුතු අනිවාර්ය ණය වාරිකවලට පසු රට සතුව ඩොලර් සංචිත නොමැති වීමයි. 2022 වනවිට ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 1900 දක්වා පහත වැටී තිබිණි. ඒ අනුව අපේ රටට තිබූ ප්‍රධාන අභියෝගය වූයේ ඩොලර් සංචිත ප්‍රමාණය ඉහළ දමා ගැනීමය. විශාල ආනයන ප්‍රමාණයක් මත රැඳුණ ආර්ථිකයකුත්, කුඩා අපනයන ආදායම සහ නිෂ්පාදන ආර්ථිකය විසින් ඇති කරන අවාසි සහගත වෙළඳ හිඟයත්, ණය වාරික සහ පොලී ගෙවීමත් පියවා ගැනීමට සමත් විදේශ විනිමය නොලැබීම නිසා ඇතිවන ගැටලුව ප්‍රධාන විය.

මෙම අර්බුදයට විසඳුමක් ලෙස වර්ධනය කරගත යුතු ක්ෂේත්‍ර ලෙස ප්‍රධාන වශයෙන් පවතින සංචාරක ව්‍යාපාරයේ ඉපයීම්, විදෙස් ශ්‍රමික ප්‍රේෂණ, සෘජු විදේශ ආයෝජන ලැබීම්, අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන මගින් ලැබෙන ණය සහ ආධාර කෙසේ හසුරුවා ගන්නේද යන කාරණය මත 2028 වසරේ ණය ආපසු ගෙවීමට හැකිද නොහැකිද යන්න තීරණය වේ. ඒ සඳහා අප බලයට පැමිණි පසු 2024 සහ 2025 වර්ෂයේ ආර්ථිකයේ හැසිරීම කිසියම් නිශ්චිත අදහසක් ලබා දෙයි.

2025 වර්ෂයේ නිල විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් මිලියන 6800 ක් දක්වා වර්ධනය කරගැනීමට හැකිවූයේ ඩොලර් මිලියන 2000ට ආසන්න ප්‍රමාණයක් වාහන ආනයනයට යෙදවීමෙන් පසුවය. 2023 වර්ෂයේ ඩො.මි. 4400ක් ලෙසද 2024 වර්ෂයේ 6100ක් ලෙසද විදේශ සංචිත රඳවා ගැනීමට හැකිවූයේ ආනයනයේ විශාලම කොටසක් වන වාහන ආනයනය තහනම් කළ තත්වයක් යටතේය. රනිල් වික්‍රමසිංහ රජයෙන් විදෙස් සංචිත වැඩි කර ගත්තා යයි තර්කයක් ගොඩනගන්නේ මෙලෙස වාහන ආනයනය තහනම් කළ පසුබිමකය. වසර පහකට ආසන්න කාලයකට වාහන ආනයනය නොකළ නිසා එයට ඉඩ ලද මුල් වසරේම විශාල වාහන ප්‍රමාණයක් ආනයනය කළද ඉදිරියේදී එය ක්‍රමානුකූලව අඩුවී යනු ඇත. ඒ අනුව ඉදිරි වර්ෂවලදී වාහන ආනයනය සඳහා අවශ්‍ය වන ඩොලර් ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් 2025ට සාපේක්ෂව අඩු වේයයි උපකල්පනය කළ හැක. ඒ මත ඉදිරි වර්ෂවලදී අවම වශයෙන් ඩොලර් මිලියන 400ක පමණ අඩුවීමක් අපේක්ෂා කළ හැක.

ලංකාවට ප්‍රධාන විදේශ විනිමය ලැබෙන මාර්ගවලින් එකක් වන සංචාරක ව්‍යාපාරයේ පසුගිය වසර දෙක තුළ සිදුවූ වර්ධනය ඉතා වැදගත්ය. ඒ අනුව ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ මෑත කාලීන ප්‍රවණතා සලකා බැලීම වටී.

**සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම**

| වර්ෂය | පැමිණි සංචාරක ප්‍රමාණය | ආදායම - ඩො.මි. |
|---|---|---|
| 2023 | 1,487,303 | 2,070 |
| 2024 | 2,053,465 | 3,170 |
| 2025 | 2,362,521 | 3,220 |

ලංකාවේ මෙතෙක් වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් සහ ආදායමක් වාර්තා කරගෙන තිබුණේ 2018 වසරේදීය. එය සංචාරකයින් 2,333,796ක් සහ ආදායම ඩොලර් මිලියන 4,380ක් ලෙසය. එහෙත් 2025 වසරේ සංචාරකයින් ප්‍රමාණය ඉහළ ගියද ඉහළම ආදායමට ළඟාවීමට නොහැකි විය.

කෙසේ වෙතත් මෙම ආදායම 2026 සහ 2027 වර්ෂවල වසරකට ඩොලර් මිලියන 400 බැගින් ඉහළ නංවා ගතහොත් පහසුවෙන් ඩොලර් මිලියන 800ක් 2028 වසර වන විට වැඩිපුර උපයා ගත හැක.

ලංකාවට විදේශ විනිමය ලැබෙන අනෙක් ප්‍රධාන මාර්ගය වන්නේ විදේශ ප්‍රේෂණයන්ය. විදෙස් රටවල රැකියා කර තම රටට මුදල් එවන ශ්‍රමිකයින් නිසා ලංකාවට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ලැබේ. අපනයන ආදායම සහ සෘජු විදේශ ආයෝජනවලට පසු වැඩිම විදේශ විනිමය ලැබෙන්නේ මෙම ශ්‍රමික ප්‍රේෂණවලිනි. පසුගිය වසර හතරෙහි විදෙස් ශ්‍රමික ප්‍රේෂණ පහත පරිදි වේ.

| වර්ෂය | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|
| ප්‍රේෂණ ප්‍රමාණය (එ.ජ.ඩො.මි) | 3,789 | 5,970 | 6,570 | 8,070 |

ඉහත සංඛ්‍යා අනුව ඉතිහාසයේ ලංකාවේ වැඩිම විදේශ ශ්‍රමික ප්‍රේෂණ ලද වර්ෂය ලෙස 2025 වසර හැඳින්විය හැක. එතෙක් වැඩිම විදේශ ප්‍රේෂණ ලැබී තිබුණේ 2016 වසරේය. ඒ, ඩොලර් මිලියන 7,240කි. ඒ අනුව 2024 වසරට සාපේක්ෂව 2025 වසරේ විදේශ ප්‍රේෂණ ඉහළයාම ඩොලර් මිලියන 1,500කි. එය ප්‍රතිශතයක් ලෙස 22.8%කි. මෙය ඉදිරියේදී 10% මට්ටමේ ඉහළ යාමක් පැවතුනද වසරකට ඩොලර් මිලියන 800ක් පමණ වැඩිපුර ලබාගත හැක.

මීට අමතරව සෘජු විදේශ ආයෝජන 2024 වසරට වඩා ඩොලර් මිලියන 500කින් පමණ 2025 වසරේ ඉහළ ගොස් ඇත. මේ සියලු සාධක සලකා බැලීමේදී ආනයන අපනයන අතර පරතරය පියවා ගැනීමෙන් පසුව වුවද ඩොලර් මිලියන 1,000ක පමණ විදේශ විනිමය අතිරික්තයක් තබා ගැනීමට හැකි බවට සංඛ්‍යා ලේඛන මගින් තහවුරු වේ.

මීළඟට අප විසින් ගෙවිය යුතු ණය වාරික සහ පොලී ගෙවීම පිළිබඳ අදහසක් ලබා ගත යුතුය. ඒ අනුව ගෙවූ සහ ඉදිරි වසරවල ගෙවියයුතු ණය වාරික සහ පොලී ප්‍රමාණය පහත පරිදි වේ. මේ තුළට රජයට අමතරව ශ්‍රී ලංකා මහා බැංකුව විසින් ගෙවිය යුතු ණය වාරික සහ පොලීද ඇතුලත් වේ.

| වර්ෂය | ගෙවීමට ඇති ණය ප්‍රමාණය - එ.ජ. ඩො.මි. |
|---|---|
| 2024 | 2,929 |
| 2025 | 3,935 |
| 2026 | 3,271 |
| 2027 | 2,531 |
| 2028 | 3,231 |
| 2029 | 3,386 |
| 2030 | 3,556 |

ඉහත සංඛ්‍යා ලේඛනය අනුව 2024 වසරේ ඩොලර් මිලියන 2,929ක්ද 2025 වසරේ ඩොලර් මිලියන 3,935ක්ද ගෙවා ඇති අතර ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව ණය වාරික සහ පොලී ගෙවීම ඇරඹෙන්නේ 2028 වර්ෂයේය. විපක්ෂය ඇතුළු බංකොලොත් දේශපාලකයින් බොරු තර්ක සහ බියක් මවමින් සමාජය මුලා කිරීමට සූදානම් වන්නේ 2028 ණය ගෙවා ගැනීමට නොහැකි යැයි උලුප්පා දක්වමිනි.

ඉහත සංඛ්‍යාවලට අනුව මෑත කාලයේ වැඩිම ණය සහ පොලී වාරික ගෙවීමට සිදුව ඇත්තේ 2025 වසරේ වන අතර එය දැනටමත් ගෙවා දමා අවසන්ය. එය 2024 වර්ෂයත් සමග සංසන්දනය කර බැලුවහොත් ඩොලර් මිලියන 1,000ක පමණ වැඩිවීමකි. වාහන ආනයනයට විශාල මුදලක් වැය කරන ගමන් මෙවැනි ඩොලර් ප්‍රමාණයක් වියදම් කිරීමට හැකි වන්නේ අප රජයේ ආර්ථික කළමනාකරණය නිසාය. එයට අමතරව 2025 වසර සමග 2028 වසර සංසන්දනය කළහොත් 2028 දී ගෙවීමට සිදුවන්නේ 2025 වසරට වඩා ඩොලර් මිලියන 700කට ආසන්න මුදලක් අඩුවෙනි. අනෙක් අතට 2025 වසරේ ගෙවූ මුදල තරම් ප්‍රමාණයක් වසර 2032දී හෝ ගෙවීමට සිදුවන්නේ නැත. (මෙම සංඛ්‍යා ලේඛන මූලාශ්‍රය අනුව සුළු වශයෙන් වෙනස්විය හැකි වුවද එය ප්‍රමාණාත්මක වෙනසක් නොවේ)

සියලු ආර්ථික දත්තයන් සහ උපනතීන් මේ මොහොතේ රටට ඉතා වාසිදායක ලෙස හැසිරෙමින් පවතින අතර පෙර පැවති දරුණු ආර්ථික අර්බුදය සමනය කර ගනිමින් සංචාරක ව්‍යාපාරය, විදේශ ප්‍රේෂණ, සෘජු ආයෝජන සහ අපනයන ආදායම ඉහළ නංවා ගනීමට රජය කටයුතු කරමින් සිටියි. ඒ අතරම ණය වාරික සහ පොලී ගෙවීම අලුත් දෙයක් නොව දැනටමත් ගෙවමින් සිටින එකක් බවත් 2028 දී වැඩිපුර ප්‍රාග්ධන කොටසක් එකතු වුවද එය කිසිදු ගැටලුවකින් තොරව ගෙවිය හැකි බවත් තහවුරු වී හමාරය. එම ණය ගෙවීමේ හැකියාව සහ විදේශ විනිමය ඉපයීම තහවුරු කර ඇත්තේ කතාවලින් නොව ක්‍රියාමාර්ගවලිනි. සංචාරක ආදායම වැඩිවීම, විදේශ ශ්‍රමික ප්‍රේෂණ ඉහළ යාම, සෘජු විදේශ ආයෝජන ඉහළ යාම වැනි කරුණුත්, දැනටමත් 2025 වසරේ ණය වාරික සහ පොලී ගෙවීම් මගිනුත් එය තහවුරු කර ඇති නිසාත් බංකොලොත් විපක්ෂයේ බංකොලොත් කතා එතරම් සැලකිල්ලට ගත යුතු ඒවා නොවේ.

> සියලු ආර්ථික දත්තයන් සහ උපනතීන් මේ මොහොතේ රටට ඉතා වාසිදායක ලෙස හැසිරෙමින් පවතින අතර පෙර පැවති දරුණු ආර්ථික අර්බුදය සමනය කර ගනිමින් සංචාරක ව්‍යාපාරය, විදේශ ප්‍රේෂණ, සෘජු ආයෝජන සහ අපනයන ආදායම ඉහළ නංවා ගනීමට රජය කටයුතු කරමින් සිටියි. ඒ අතරම ණය වාරික සහ පොලී ගෙවීම අලුත් දෙයක් නොව දැනටමත් ගෙවමින් සිටින එකක් බවත් 2028 දී වැඩිපුර ප්‍රාග්ධන කොටසක් එකතු වුවද එය කිසිදු ගැටලුවකින් තොරව ගෙවිය හැකි බවත් තහවුරු වී හමාරය.



"අධිරාජ්‍යවාදයේ ස්වභාව නිරූපී අංග ලක්ෂණය රැඳී පවතින්නේ, අපට පෙනෙන්නට තිබෙන පරිදි, ලෝකය පීඩිත ජාතීන් විශාල ගණනක්ද, පීඩක ජාතීන් ඉතාමත් කුඩා සංඛ්‍යාවක්ද, වශයෙන් බෙදී තිබීම සහ මෙහි පසුකී ජාතීන්ට යෝධ ධනස්කන්ධයක් සහ බලවත් යුද්ධ හමුදා තිබීම කෙරෙහිය."

**ලෙනින්,**

**පෙරදිග ලෝකයේ ජාතික විමුක්ති ව්‍යාපාර, 326 පිටුව**

# මඩ සහ අවලාද!



විවේචනය සහ ප්‍රශ්න කිරීම ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය කොටසකි. නමුත් විවේචන එල්ල විය යුත්තේ සත්‍ය සාක්ෂි සහ වගකීම මත පදනම්ව විය යුතුය. ඒ වෙනුවට පුද්ගල චරිත ඝාතනය, පෞද්ගලික අපහාස සහ මඩ ප්‍රචාර යොදාගැනීම යනු දේශපාලන සංවාද නොවේ. එය හුදෙක් දේශපාලන සංවාදයකින් ඔබ්බට ගිය විකෘති මානසිකත්වයන්ගේ පිළිබිඹුවකි. එවැනි දේ තුළින් හරවත් දේශපාලන සංවාද වියැකී ගොස් හරසුන් සංවාදයක් නිර්මාණය වේ.

වර්තමානය වන විට ලංකාවේ දේශපාලනය තුළ විපක්ෂ කණ්ඩායම් සිදුකරමින් හිඳින්නේ මෙවැනි හරසුන් සංවාද ගොඩනගමින් ජන මනස ආකල්පමය වශයෙන් ඉතා පටු තැනකට ගොනු කිරීමට උත්සාහ කිරීමයි.

විපක්ෂයේ අය එවැනි පහත් තත්ත්වයකට ඇද වැටීමට බලපාන හේතු ගණනාවක් තිබේ. විශේෂයෙන්ම ඔවුන් මේ වන විට සමාජයෙන් ප්‍රතික්ෂේප වී ඇති බව ඔවුන් හඳුනාගෙන ඇත. එවැනි තත්වයක් තුළ ඔවුන්ගේ දේශපාලන ගමන් මග ස්ථාවර කර ගැනීමට විවිධ උපායමාර්ග අත්හදා බලමින් සිටී. ඒ අතරින් ආණ්ඩුව කෙරෙහි කිසිදු සාධාරණ විවේචනයක් නොමැති වූ විට මඩ සහ අවලාදවලින් ආණ්ඩුව කෙරෙහි ජනතා අප්‍රසාදයක් ඇතිකළ හැකි යැයි ඔවුහු විශ්වාස කරති. ඒ නිසා දේශපාලන විවේචනවලින් ඔබ්බට ගොස් ඉතා නින්දිත සහ පහත් අයුරින් පුද්ගල චරිත ඉලක්ක කර ගනිමින් මඩ ගැසීම සහ අවලාද නැගීම ඔවුන්ගේ උපක්‍රමය බවට පත් කරගෙන තිබේ. ඒ අනුව විටින් විට ආණ්ඩුවේ මැති ඇමතිවරුන් ඉලක්ක කර ගනිමින් මඩ ප්‍රහාර දියත් කරන ලදී. මුල් අවස්ථාවේ ජනාධිපතිවරයාගේ සිට ප්‍රසිද්ධ තලයේ සියලු මැති ඇමතිවරුන් මෙම ප්‍රහාරයන්ගේ ඉලක්කය විය.

අවසන ඔවුන් ඉතා නින්දිත ලෙස කාන්තාවන් ඉලක්ක කර ගනිමින් අපහාස කිරීමේ පහත් උපක්‍රමය තෝරාගනු ලැබීය. එහිදී ප්‍රධානම ඉලක්කය වූයේ අග්‍රාමාත්‍යවරියයි. පසුගාමී ආසියාතික සමාජ මනෝභාවයන්ගෙන් යුක්ත ශ්‍රී ලාංකේය ජනතාවට සංස්කෘතිය හා සදාචාර පිළිබඳ ඇත්තේ නිවැරදි නොවූ කියවා ගැනීමක් වුවත් ඔවුන් විශ්වාස කරන සංස්කෘතිය හා සදාචාරය පිළිබඳ ඇත්තේ අන්ධ භක්තියකි. ඒ අනුව පරාජිත දේශපාලකයාට එම තුරුම්පු පාවිච්චි කරමින් ජනතාව මුලා කිරීමට යම් හැකියාවක් ඇත. පොදු ජනතාවගෙන් යම් කොටසක් අවිචාරශීලී ලෙස බොරු බේගල් විශ්වාස කරමින් ඒවා තව තවත් සමාජ ගත කරන්නට කටයුතු කරයි. ආගම ජාතිය හා සංස්කෘතය යනු රට විනාශයෙන් විනාශයට ඇද දැමූ දේශපාලකයාගේ අවසන් නැවතුම්පොළයි. ඔවුන්ගේ පරාජයන් වසා ගන්නට මෑත කාලයේදී ඉතාමත් නිර්ලජ්ජිත ලෙස ජාතිය, ආගම සහ සංස්කෘතිය ඉත්තන් කරගන්නා ලදී.

අග්‍රාමාත්‍යවරිය සහ අනෙකුත් මන්ත්‍රීවරියන්ට ඔවුන් අපහාස කරන්නේද මේ සංවේදී කාරණා පදනම් කර ගනිමිනි. කාන්තාවකගේ ඇඳුම, කොණ්ඩය, කතා විලාශය මෙන්ම අතිශය පෞද්ගලික වූ ලිංගික ලැදියාවන් පිළිබඳව ද කතන්දර පිට කතන්දර හදන්නට විපක්ෂයේ ඇතැම් බංකොලොත් දේශපාලඥයෝ කටයුතු කරමින් සිටිති. එවැනි අසත්‍ය ප්‍රචාරයන් තුළින් ආණ්ඩුවේ දැවැන්ත කාන්තා ප්‍රතිරූපයන්ට හානි කරන්නට ඔවුහු උත්සාහ කරති.

විපක්ෂයට සහ විපක්ෂයේ පරාජයෙන් ප්‍රතිලාභ අහිමි වූ සමාජ මාධ්‍ය වීරයන් ලෙස සිතන පිරිසකගේ වුවමනාව කුමක් ද? සැබවින් ම මෑත ඉතිහාසයේ අග්‍රාමාත්‍ය තනතුර මෙතරම් සක්‍රීය වූවක් නොවේ. පසුගිය පාලන කාලවලදී එය හුදු නාමික තනතුරක් පමණි. විධායක ජනාධිපති විසින් අගමැති තනතුර ඉහළට එසවෙන්නට අවස්ථා සැලැස්වූයේ නැත. නමුත් මාලිමා ආණ්ඩුවේ අග්‍රාමාත්‍යවරිය කැපී පෙනෙන ලෙස සක්‍රීය ව තම වගකීම් මැනවින් ඉටු කරමින් හිඳියි. එය දකින බංකොලොත් විපක්ෂයට සමාජ භාවිත වචනයෙන් කිවහොත් දිරවන්නට නොහැකිය. ඉතින් ඔවුන් කුමන හෝ අයුරකින් මේ ක්‍රියාකාරීත්වය අඩපණ කිරීමටත් ජනතා ප්‍රසාදය බිඳ දැමීමටත් උත්සාහ දැරීම පුදුමයට කරුණක් නොවේ. අග්‍රාමාත්‍යවරිය පමණක් නොව මාලිමා ආණ්ඩුවේ සියලු මන්ත්‍රී සහෝදරියන් පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටත සමාජයේත් කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරමින් හිඳීම නිසා වරින් වර මඩ ප්‍රහාරයන්ට ගොදුරු වන්නට සිදුව තිබේ.

රටක් ලෙස අප මේ පිළිබඳව ලැජ්ජා විය යුතුය. එසේ ම ගැහැනුන් ලෙස එක මිටට එකතු වී ගැහැනුන්ට එරෙහි මේ නින්දිත අවලාදවලට එරෙහි විය යුතුය. පරාජිත දූෂිත දේශපාලනයේ අඳුරු සෙවණැලි යළි හිස ඔසවන්නට දරන උත්සාහයන් දුටු විගස පරාජය කිරීමට ගැහැනුන් ලෙස අපට හැකියාව තිබේ. 76 වසරක ශාපය අවසන් කරන්නට පෙරමුණ ගත් ලෙසටම අපගේ සිහිනය සැබෑ කරගැනීමට බාධා කරමින් කෙඳිරිළි නඟන්නන් වෙත දැඩි සේ විරෝධය දැක්වීම තුළින් ඔවුන්ගේ කටවල් වසා දැමිය යුතුය.

කාන්තාවන්ට නිසි ගෞරවය හිමිවෙන පාලනයක් තුළ කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත වන බව අපට කිසිදු සැකයක් නැත. ආකල්පවලින් ද පොහොසත් රටක් වෙනුවෙන් මේ සියලු ප්‍රතිගාමී බලවේගවල කූට කුමන්ත්‍රණ පරාජය කිරීම වෙනුවෙන් ගැහැනු අපි හැමදාමත් එක මිටක රැඳී සිටිය යුතුමය.

## ගැහැනුන් එක්ව මකනවමයි කළු චිත්‍ර...

පෑගුණු ලෙස පයට දූවිල්ලක් සේමා
නොනගා කෙඳිරියක් දුක වූවත් බෝමා
හදවත මියෙන යුරු විඳගන්න ද කෝමා
ගැහැනියකගෙ දුකට තව කුමටද තේමා

අඳුරේ පිපී අඳුරෙ ම මුකුලිත කුසුමන්
දැනුනි ද කිසිත් නොදොඩා හෙලනා
සුසුමන්
හෙට හිරු සමඟ විකසිත විය යුතු
පියුමන්
හිනැහිය යුතුයි රඳවා කතකගෙ අභිමන්

ඇඟලා දුගඳ මුසු වූ සුචරිත වස්ත්‍ර
තවරා කටු කිනිති දරනා රළු පත්‍ර
ඔසවන්නට හදන මුත් එක එක චත්‍ර
ගැහැනුන් එක්ව මකනවමයි කළු චිත්‍ර



## අපිට ගහන මඩ, විපක්ෂයටම භූමරංගයක් වේවි!

**ඔෂානි උමංගා**
**කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීනී**

වර්තමානයේ ගැහැනුන්ගේ පෞරුෂය බිඳ දමා, ඇයව චරිත ඝාතනයට ලක් කිරීම අතිශය සුලභ සහ පහත් ප්‍රවණතාවක් බවට පත්වෙලා. පුරුෂයෙකුට එල්ල වන විවේචනයකට වඩා ගැහැනියකට එල්ල වන මඩ ප්‍රහාරය ඇයගේ පවුල් ජීවිතයට, රැකියාවට සහ මානසික සෞඛ්‍යයට ඇති කරන බලපෑම අතිමහත්.
මෙහිදී දේශපාලනයේ නියුතු කාන්තාවන් ඉලක්ක කිරීම සුලභව දකින්නට ලැබෙනවා. විශේෂයෙන්ම සුන් බුන් ගොඩක් බවට පත්වෙලා තියෙන විපක්ෂයේ කොටස් ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය කාරණා විවේචනය කරනවාට වඩා එම නියෝජිතයින්ගේ පෞද්ගලික ජීවිත විකෘති කර පෙන්වන මාධ්‍ය මෙහෙයුමක් ක්‍රියාත්මක කරල තියෙනවා.
විපක්ෂයේ පිරිස් තමන්ට එරෙහි දේශපාලනයේ යෙදෙන කාන්තාවන්ට එරෙහිව සිදුකරන මේ මාධ්‍ය මෙහෙයුම්වල ප්‍රතිඵලයක් විදියට හෙට දිනයේදී මේවාට මුහුණ දෙන්නේ ඔබගේ මව, සොයුරිය, දියණිය හෝ හිතවතියක් විය හැකියි. ඒනිසා මේ ප්‍රවණතාවයට එරෙහිව ගැහැනු එක මිටකට එක්විය යුතුයි.


## ජන මතය!

**පසු ගිය ජනවාරි මස පළමුවෙනිදා 2026 නව වසර පිළිගැනීම සහ රාජකාරි ආරම්භ කිරීම සඳහා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විසින් සැමරුම් උත්සවයක් සංවිධාන කර තිබුණි.**
**අදින් ඇරඹි 2026 වර්ෂය ආරම්භයේ සිට "මුළ ඉඳන් පටන් ගමු" යන දැක්ම සහිතව ශ්‍රී ලාංකීය අනාගත පරපුර නැණ ගුණ සපිරි, සවිමත් පුරවැසියන් බවට පත්කිරීම අරමුණු කරගනිමින් මුල් ළමාවිය සංවර්ධනය ප්‍රමිතිගත කිරීම, පහසුකම් සංවර්ධනය කිරීම සහ ළමා රක්ෂණය ඇතුළු අනෙකුත් අවශ්‍යතා සම්පාදනය සඳහා වැඩි ධාරිතාවක් යොදමින් කටයුතු කිරීම අමාත්‍යාංශයේ ඉලක්කය වී ඇත.**



**දිට්වා සුළි කුණාටුව හේතුවෙන් දෙමව්පියන් හෝ එක් අයෙකු හෝ අහිමිවූ දරුවන් වෙනුවෙන් සකස් වෙන වැඩපිළිවෙළ සම්බන්ධව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ ටාරා ලංකා පදනම අතර සාකච්ඡාවක් පසුගියදා පැවැත්විණි. නියෝජ්‍ය අමාත්‍ය නාමල් සුදර්ශන සහෝදරයා සමග මෙම අවස්ථාව සඳහා ඕස්ට්‍රේලියාවේ සිටින ශ්‍රී ලාංකියෝ වෙනුවෙන් පැමිණි නියෝජිතයන් පිරිසක්ද සහභාගි වී සිටියහ.**






**ලොව පුරා සිටින රැකවරණය සලසන්නන් (Caregivers) සහ දෙමාපියන් වෙනුවෙන් ජාත්‍යන්තර මට්ටමේ සහයෝගීතා රාමුවක් සකස් කිරීම අරමුණු කරගනිමින් ආරම්භ වූ ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නුවර පැවැත්වූ ,Global Caregiver Forum 2026, සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය සරෝජා පෝල්රාජ් සහෝදරිය සහභාගි විය. ස්පාඤ්ඤ ලෙටීසියා මහරැජින (HM Queen Letizia of Spain) ගේ ප්‍රධානත්වයෙන්, ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) අධ්‍යක්ෂ ජනරාල් Dr.Tedros Adhanom Ghebreyesus ඇතුළු ලෝක නායකයන්ගේ සහ විෂය ප්‍රවීණයන්ගේ සහභාගීත්වයෙන් මෙය පවත්වන ලදී.**

# මිනිරන් පතලේ පාතාලය හා Stranger Things පාතාලය




පාතාලය යන්නට සිංහල සාහිත්‍යයේ සංස්කෘතිකමය අර්ථයක් ඇත. යමෙකු 'ඇද වැටුණහොත්, නැවත ඉහළට පැමිණීමට නොහැකි ස්ථානය' යන අර්ථයෙන් පාතාලය යන්න ව්‍යවහාරිත බව පෙනුණද එහි සංස්කෘතිකමය අර්ථය වන්නේ නැවත ගැලවිය නොහැකි උගුලක සිරවීමක් යන්නයි. සිංහල ජනකවි අතර එන පතල් කවිවලින්, නිශ්චිතව මිනිරන් පතල් තුළ ජීවිතය ගැන කියවෙන බවක් හැඟවුණේ වුවද, ඉන් තමාට ජය ගත නොහැකි උගුලක තමා සිරගතව සිටින බවක් විශද කිරීමට ජනකවියා උත්සාහ ගනී.

ඉන්නෙත් දුම්බරයි මහ කළු ගලක් යට

කන්නෙත් කරවලයි රට හාලේ බතට

බොන්නෙත් බොර දියයි පූරුවෙ කළ පවට

යන්නෙත් කවදාද මව්පියො දකින්නට

මෙහි අවසන් පදය වන "යන්නෙත් කවදාද මව් පියො දකින්නට" යන්නෙන් තමා සිරගතව සිටිනා උගුලේ තරම මැනවින් පැහැදිලි වේ. තමා කොතරම් අකැමැති වුවද එහි රැඳී සිටීම හැර විකල්පයක් නොමැති බවත්, පලා යාමට කොතරම් කැමැත්තකින් පසුවුවද එය මඟ හැර යා නොහැකි බවත් මෙම කවියෙන් තහවුරු කරයි.

පාතාලය යන්නට වඩා පාතාල ලෝකය යන්න සිංහල බෞද්ධ සාහිත්‍යයට සමීප වචනයකි. පාතාල ලෝකය යන්නෙන් අපාය හැඳින්වෙන බව සාහිත්‍යය පරිශීලනය කිරීමෙන් පෙනී යයි. 'බුදුනට අපහාස කළ දෙව්දත් මෙන්ම චිංචිමානවිකාවද පොළව පලාගෙන අපායට ඇදගෙන ගිය' බව බෞද්ධ සාහිත්‍යයේ දැක්වේ. ඒ ඔස්සේ කල්පනා කිරීමේදී පාතාලය යනු අපගේ ලෝකයට යටින් ඇති යමක් යන්නට වඩා, කිසිදා අපට විවර නොවන ගුප්ත බවක් සහිත දෙයක් ලෙස හැඳින්වීමට සාහිත්‍යකරුවා උත්සාහ ගෙන ඇති බව පෙනී යයි.

The Duffer Brothers විසින් නිර්මාණය කරන ලද Stranger Things නම් ඇමරිකානු, විද්‍යා ප්‍රබන්ධ, horror ශානරයට වැටෙන ටෙලි නාට්‍යයද පාතාලය හා සැබෑ ලෝකය සිය පසුතලය කර ගනී. මෙය 1980 දශකය පසුබිම් කරගත් නිර්මාණයකි. පළමු කතාංගය 1983 නොවැම්බර් ශීත සමය පසුබිම් කර ගනී. සමීප යහළුවන් තිදෙනෙක් අතරින් Will Byers නම් දරුවා හදිසියේම අභිරහස් ලෙස අතුරුදන් වේ. ඔහුගේ අතුරුදන්වීමට සමාන්තරව අසල පර්යේෂණාගාරයක රැකවරණය ලබමින් පසුවන Eleven නම් යොවුන් ගැහැනු ළමයෙක්ද අතුරුදහන් වේ.

එල්වන් යනු සාමාන්‍ය දැරියක නොව සුවිශේෂී දැරියකි. විල් බයර්ස්ගේ මිතුරන්, මව හා නගරයේ පොලිස් ප්‍රධානියා ඔහු සොයමින් යන අතර අසාමාන්‍ය ලෙස මේ ලෝකය හා උඩුකුරුව පවතින මේ ලෝකයේම අනෙක් ලෝකයට පිවිසෙන දොරටුවක් සොයා ගනියි. මෙය උඩුකුරු වූ ලෝකය නිරන්තර අඳුරෙන් පෙළෙන අතර අප්‍රියජනක හා විෂකුරු දේවලින් සමන්විතය. එහි "ඩිමොගෝගොන්" (Demogorgon) නම් අද්භූත සත්වයෙක්ද වාසය කරයි. මෙම ටෙලි කතා මාලාවේ පළමු හා දෙවන කොටස් මුළුමනින්ම වෙන්වන්නේ හොපර් නම් පොලිස් නිලධාරියා සහ ජොයිස් නම් විල් බයර්ස්ගේ මිතුරා උඩුකුරු ලෝකයට ගොස් විල්ව බේරා ගැනීමේ වික්‍රමයත්, නැවත නිවසට පැමිණෙන විල් බයර්ගේ පැවැත්මත් පෙන්වීමටය. ඔහු අඳුරු ලෝකයෙන් මිදුණේ වුවද, එහි බලපෑමෙන් මිදීමට අසමත්ය. මේ වික්‍රමයේදී හොපර් හා ජොයිස් සමග එක්වන එල්වන් ඩිමොගොගොන්ව මරා දැමීමට සිය සම්පූර්ණ ශක්තියම වැය කරයි. ඉන් පසුව ඇය අසාමාන්‍ය ලෙස අතුරුදහන් වේ.

මෙම කතාව හුදු විද්‍යා ප්‍රබන්ධයක් ලෙස පෙනී ගියද 70 හා 80 දශකවල ඇමරිකාවේ පැවැති දේශපාලන තත්වය පිළිබඳව අදහසක් අප තුළ ඇති කරයි. සීතල යුද්ධ කාලය තුළ සිය අනෙකා වන සෝවියට් දේශය අබිබවා යාමට ඇමරිකාව විසින් සිදුකළ පර්යේෂණ හා බලයේ දූෂණය පිළිබඳව මෙම නිර්මාණය ඉඟි පළකරයි. මෙහිදී එම පර්යේෂකයින් කිසියම් ආකාරයකින් සතුරාගේ මනස පාලනය කිරීම, මනෝ ඖෂධ පරීක්ෂා කිරීම වැනි පර්යේෂණවල යෙදුණු බවට මතයක් ඇත. මෙහි එන "හොකින්ස් ජාතික පර්යේෂණාගාරය" විසින් එල්වන් වැනි ළමුන් පරීක්ෂණ වස්තූන් ලෙස භාවිත කිරීම, මනුෂ්‍යත්වය නොතකා ඔවුන්ගේ ශක්තීන් අධිකාරිය සඳහා භාවිත කිරීම සංකේතීය අර්ථයක් විශද කරයි.

ඒ අනුව Stranger Things හි "ලෝක දෙක" (සාමාන්‍ය ලෝකය හා උඩුකුරු ලෝකය) යනු අද සමාජයේ පවතින යථාර්ථ දෙකක් හෝ සමාජ තල දෙකක ප්‍රබල ප්‍රතිරූපයක් ලෙස ගත හැකිය. එම ලෝක දෙක නම් දෘශ්‍යමාන ලෝකය හා සැඟවුණු යථාර්ථය යන ලෝකයන් දෙකයි. දෘශ්‍යමාන ලෝකය සුන්දරය. නිසංසල, සුවදායී ඇමරිකානු නගරයකි. ඒ නගරයේ ශෙරීෆ්වරයා හා නගරාධිපතිවරයා සාමාන්‍ය පෙනෙන ලෝකය නියෝජනය කරයි. ඔවුන් දෘෂ්‍යමාන රජයේ නියෝජනයයි. එම රජයම නගරාධිපතිවරයාට හා ශෙරීප්වරයාට රහසින්, ඔවුන්ගේ දැනුවත්භාවය හෝ නොමැතිව උඩුකරු වූ තවත් ලෝකයක් නිර්මාණය කර පවත්වාගෙන යයි. බැලූ බැල්මට සියල්ල සාමාන්‍ය පරිදි පවතින බවට පෙනුනේ වුවද එය එසේ නොව බව පාලක පන්තියම මැනිවින් දනිති. මාධ්‍ය හා ප්‍රචාරණය මගින් සත්‍යයන් සඟවනු ලබයි. එහෙත් එහි අඳුරු, විෂ සහිත, භීෂණකාරී, සහ පාලකයින් විසින් සැඟවූ ගැඹුරු රහස් පවතී. රහස් පර්යේෂණ, දරුවන් අනාචාරයේ යෙදවීම, සංවිධානාත්මක අපරාධ සිදුවෙමින් පවතී. විශේෂත්වය වන්නේ ජනතාවට සාමයත්, සංහිඳියාවත් ගෙන ඒමට පිළින දුන් පාලකයින් විසින්ම මේවා පවත්වාගෙන යාමයි.

මෙසේ සාමාන්‍ය ලෝකයට උඩුකරු වූ සමාන්තර ලෝකයක් පවත්වාගෙන යාමට විශාල ධනයක් මෙන්ම විශාල බලයක්ද අත්‍යවශ්‍යය. රජයේ අනුග්‍රහය සහිතව "හොකින්ස් ජාතික පර්යේෂණාගාරය" ස්ථාපනය කර ඇත. අප දන්නා ඉතිහාසය තුළ මුස්ලිම් අන්තවාදීන්ට මෙන්ම සිංහල ජාතිවාදීන්ට එකම අමාත්‍යාංශයක, එකම වැය ශීර්ෂයකින් මුදල් ගෙවූ බව අප හොඳින්ම දන්නා කරුණකි. යම් කරුණක් වෙනුවෙන් ජාතික ධනය වැය කළ පමණින් එය නීත්‍යානුකූල වන්නේ නැත. ඒ මඟ ඔස්සේම ඉදිරියට ගමන් කිරීමෙන් නීති විරෝධී මුදල් හා කළු මුදල් මෙයට එකතු වේ. එය ආයෝජන හෝ රාජ්‍ය හවුල්කාරීත්ව වැනි විවිධ නම්වලින් පැමිණෙනු ඇත. එහෙත් අරමුණෙහි වෙනසක් නැත. සිදුවන්නේ සිය බලය වෙනුවෙන් අසීමිත මහජන ධනයක් වැයකිරීමයි.

සාමාන්‍ය නීති විරෝධී ක්‍රියාවන්ට අමතරව එමඟින් සුදු වන දූෂණ හා අක්‍රමිකතා වසා ගැනීමට ජනමාධ්‍ය හා ප්‍රචාරණය යොදා ගැනීම මෙම සමාන්තර ලෝක පිළිබඳ කතාන්තරයේම දිගුවකි. ජනතාවගේ අවධානය වෙනතකට යොමු කරවීමට මෙන්ම තමා විසින් ගොතනු ලබන ප්‍රබන්ධයන් සමාජය තුළ සත්‍යයේ වේශයෙන් තහවුරු කරවීමටත් මෙය අත්‍යවශ්‍යය. විෂ මත්ද්‍රව්‍ය රටින් තුරන් කිරීමේ සැබෑ අරමුණ වෙනුවෙන් කටයුතු කරනවා වෙනුවට විවිධ නම්වලින් යුත් බොළඳ මෙහෙයුම් ඔස්සේ දරුවන්ගේ පාසල් බෑග් පරීක්ෂා කිරීම වැනි සරල කරුණුවල සිට, පාතාලේ අපරාධකරුවන් නඩු විභාගයකින් තොරව මරා දැමුවාට කම් නැති බවට වන මතවාදය නිර්මාණය කිරීම දක්වාම මෙම ප්‍රචාරණ හා ප්‍රවර්ධන උපක්‍රම පැතිර පවතී.

ඇමරිකාවේ මෙම තත්වයම 1990 වසරේ දී පමණ මෙරට තරුණ ප්‍රජාව, රජයට එරෙහිව ගෙන ගිය අරගලය මර්දනය කිරීමෙන් අනතුරුව රජය විසින් මුහුණ දෙන ලදී. ජනතාව වෙනසක් අපේක්ෂා කරද්දී එවකට පාලන බලය හෙබවූ ප්‍රභූ පාලකයින් වෙනසට බිය වූ අතර ඊට එරෙහිව සමාජය තුළ නිර්මාණය කළ බිය හා අප්‍රසාදය (Othering) මීට සමාන තත්වයකි. තමා විසින් මවන ලද අඳුරු, ගුප්ත හා විෂ සහිත ලෝකය තහවුරු කිරීමට විවිධ මෙහෙයුම් ඔස්සේ භීතිය පැතිර වූ බව ඔප්පු නොකරන ලද සත්‍යයකි. සෑම සත්‍යයක්ම ඔප්පු කිරීම අත්‍යවශ්‍ය නොවන අතර ලෝකයේ බොහෝ සත්‍යයන්, සත්‍යයන් ලෙස පිළිගන්නේ ඒවා සාධක සහිතව ඔප්පු කළ නිසා නොවේ. එම කාලය සම්බන්ධ සත්‍යයන්ද එවැන්නකි.

මේ යථාර්ථය විසින් සමාජය කාණ්ඩ දෙකකට වෙන් කිරීම අත්‍යවශ්‍ය විය. එහිදී පාලකය පංතිය "අප" නම් කාණ්ඩයට අයත් වූ අතර සාමාන්‍ය ජනතාව "ඔවුන්" නම් කණ්ඩායමට අයත් විය. ප්‍රභූත්වය හා නිර්-ප්‍රභූත්වය අතර පරතරය නිර්මාණය කරන ලද්දේ මෙම සංකල්පය විසිනි. අසූව දශකය ගෙවී වසර 40ක් පමණ ගතව ඇති අද දවසේ පවා, ආනන්ද සමරකෝන් එළිමහන් රඟහලේ දී රැස්වීමක් අමතන වයස යාන්තම් විස්ස ඉක්මවූ තරුණියකගේ මුවින් " අර ඔයාලගේ පංතියේ එකා" යන යෙදුම උපදින මූලාශ්‍රය එයයි. යමෙක් සමාජය වෙනස් කිරීමට සාකච්ඡා කරන්නේ නම් ඔහු/ඇය අනවශ්‍ය, භයංකර හෝ සමාජ සතුරු අයෙකු ලෙසට චිත්‍රයක් ඇති කරන ලදී.

අප රටේ පාතාලය, දරුණු ගනයේ අපරාධ සහ විෂ මත්ද්‍රව්‍ය හා බැඳුනු පාතාලය සම්බන්ධයෙන් තත්වයද Stranger Things ටෙලි නාට්‍යමාලාවේ සිදුවීම්වලට සාකල්‍යයෙන් සමානය. අප රටේද බලය වෙනුවෙන් දූෂිත දේශපාලනය, දූෂිත රාජ්‍ය නිලධාරීන්, විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මෙන්ම දරුණු අපරාධකරුවන් සම්මුතිගතව උඩුකුරු වූ ලෝකයක් නිර්මාණය කර, පවත්වාගෙන ගිය බවට මේ වන විට සාක්ෂි මතුව ඇත. මෙම තත්වය ගැඹුරින් විමසීමේදී අපට දෘෂ්‍යමාන වූ සිවිල්/සාමාන්‍ය ලෝකය පොදු පුරවැසියා රැවටීමකට ලක් කර ඔවුන් "සාමාන්‍ය ජීවිතය" ගෙවන බවට වන චිත්‍රය යනු බලවතුන් විසින් නිර්මාණය කරන ලද පෙනුමක් පමණි. එහි පිටුපස, සාමාන්‍ය ජනතාව නොදන්නා, ඔවුන්ගේ දෘෂ්‍යමාන නොවන, අඳුරු යථාර්ථයක් සැඟවී ඇත.

සැබැවින්ම පාතාලය නිර්මාණය කර පවත්වාගෙන යන්නේ අප වෙනුවෙන්මය. එනම් සාමාන්‍ය ලෝකය තුළ අප මුලා කරමින්, අපට එරෙහිව බලයක් නිර්මාණය කර ගැනීමට බලවත් පිරිසගේ අවශ්‍යතාව සපුරා ගැනීම වෙනුවෙනි. එම ලෝකයේ බිහිසුණු සත්වයින් ඔවුන්ට සේවය කරනු වස් අප බිලි ගැනීමට නිරන්තරයන්ම මාන බලමින් සිටීම අතිශය සරල හා ස්වභාවික කරුණක් බව අවසාන වශයෙන් සටහන් කළ යුතුය.



"මිනිසා මාලිගාවකදී හා පැල්පතකදී වෙනස් ආකාරයෙන් සිතයි. සාගින්න නිසා, දුක්ඛිත තත්වය නිසා ඔබට ඔබේ සිරුර තුළ පෝෂණය සඳහා දෙයක් නොමැති නම්, ඒ ආකාරයෙන්ම, ඔබේ ඔළුවේ, ඔබේ මනසේ සහ හදවතේ සදාචාරය පෝෂණය සඳහා දෙයක් නොමැත."

**ලුද්විග් ෆෙයාබාහ්ග්**

# පොලිටිකල් පංතිය

පොලිටික්ක මොනවද පොත් ගොඩකුත් අමාරුවෙන් උස්සගෙන පංතියට 'කඩාවදිද්දි' ළමයි හිටියෙ 'විෂය බාහිර ක්‍රියාකාරකමක'. ක්‍රියාකාරකමක් කියල බර වචනෙට කිවුවට ළමයි හිටියෙ චෙස් බෝඩ් එකක් වට කරගෙන. එන කෙනෙකුට පෙනුණෙ පංතියෙම නැමුණු ඔළු ටික එකට එකතු වෙලා. ඇද්දෙ දෙන්නෙක් වුණාට කට්ටිය වටවෙලා හිටියෙ දෙපැත්තටම උපදෙස් දෙන්න උපදේශකයො පත් කරගෙන වගේ.

"ඔය මොකද ළමයිනේ බූරු ගහනවද?" පොලිටික්ක ඇහුවෙ පංතියම දෙකේ කොළේට දාලා.

"අයියෝ නෑ සර්... මොන බූරුවොද?" කවුරු හරි ඔළුව උස්සන්නෙ නැතුවම උත්තර බැන්ද.

"සර් දන්නෑ... මෙතන යුද්ධයක් සර්. රජවරු, සෙන්පතියො දරුණුවට හැප්පෙනවා" මංජුව ප්‍රේහේලිකා භාෂාවෙන් උත්තර දුන්න.

"ඔයාලා තුවාල කරගන්නෙ නැතුව ඕනෙ දෙයක්" පොලිටික්කට තාමත් මීටර් නැහැ.

"තුවාල වෙන්න දෙයක් මෙතන නෑ සර්. මෙතන චෙස් ගේමක්" කනිය පැහැදිලි කරන්න හැදුව.

"ආ... චෙස්... අර මෙහෙම සෙල්ලම් කරන්නෙ... අපි නොදන්න චෙස්" පොලිටික්ක ඇඟිලිවලින් කැරම් ඩිස්ක් එක විදින විදිහ පෙන්නුව.

"නෑ සර් මේක අර චෙස් අදිනවා කියන්නෙ. කොටුවෙන් කොටුවට අදින්නෙ. එක එක හැඩේ ඉත්තො..." පොලිටික්ක කිවුවෙ ඇත්තටමද නැත්තම් ජෝක් එකටද කියල වසන්තියට ෂුවර් නැහැ.

"පිස්සුද ළමයො මම දන්නැද්ද චෙස්. මම විහිළුවට කිවුවෙ" පොලිටික්කට ලැජ්ජා හිතුණ. "චෙස් නම් කවද ඇදගන්න බැරිද ළමයිනේ... ඔයාලා දන්නවද මොඩියුල් කියල දෙන ඉස්කෝලෙ පෙළ පොත් අසභ්‍ය වෙලා කියල"

"කවුද සර් ඕවා කියන්නෙ... විපක්ෂෙ සුන්බුන් කට්ටිය නේද?" මංජුවත් අරින්නෙ නෑ.

"විපක්ෂෙ අය තමයි කියන්නෙ. කුණුහරුප ලින්ක් දාලලු තියෙන්නෙ" පොලිටික්ක අවුලට උප්පැන්න ලියනවා.

"ඕක පරණ කතාවක්නෙ. ඔය අවුලකට තිබුණ ඒවා අයින් කළා කියනවනෙ. අපි සර්ල වගේ සාමාන්‍ය මිනිස්සු ඕවා දන්නෙත් නැහැ. කුණුහරුප සයිට්වලට නිතර යන එන අය තමයි ඒවා හොඳටම දන්නෙ. නැත්තම් කොහොමද අඳුනගන්නෙ" සමන හේතුඵල වාදෙට ආවා.

"'මේ කොල්ල කුණුහරුප සිංදු උරුවම් බානවා' කියල චීචර්ට පැමිණිලි කරපු ගෑනු ළමය වගේ වැඩනෙ. කුණුහරුප සිංදුව දන්න අයට විතරයි උරුවම් බෑවෙ මොකද්ද කියල තේරෙන්නෙ. දන්නෙ නැති අයට අවුල තේරෙන්න විදිහකුත් නැහැ" මංජුව උරුවම් බාන්න කටත් හදාගත්ත.

"දැන් අන්තිමට අපි විරුද්ධයි අපි විරුද්ධයි... මෙන්න අධ්‍යාපනය අසභ්‍යකරණය කරනෝ... කියලා වචනෙකුත් හදාගෙන කෑගගහ හිටපු අය දැන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අපි නම් විරුද්ධ නෑ කියල කියනවා. හයේ දෙමව්පියන්ගෙ විරෝධෙන් බේරෙන්න. කලින් වතු කම්කරුවන්ගෙ වැටුප් වැඩිකරන්න රජයේ සල්ලි දෙන එක වැරදියි කියලා මැරෙන්න හැදුවා. අල්ලස් එකට පැමිණිලි කළා. පස්සෙ කම්කරුවන්ගෙ විරෝධය එයාලට එල්ල වෙනකොට වැඩේ ඇකිළුවා. දැන් ආණ්ඩුව ප්‍රතිසංස්කරණ නවත්තල අවුලක් කළා වගේ තමයි එයාලගෙ කතාව... අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කොහොමත් ඉස්සරහට යනවා. බල්ලො බිරුවා කියල තවලම් නවතින්නෙ නෑනෙ. හැබැයි මොනවහරි අවුලක් තියේනම් හරිගස්සන වගකීමකුත් ආණ්ඩුවට තියෙනවනෙ. ඒවා නොසලකා ඉස්සරහට යන්නත් බෑනෙ. මොකද අවුලක් තිබුණොත් පෙළ පොත් හදපු අය නෙමයිනෙ... ආණ්ඩුවටනෙ බෙල්ල තියන්න වෙන්නෙ. පහුගිය දවස්වල ඒක පෙනුණානෙ..." සමන හුස්මක් අරගෙන ගියර් එක මාරු කරගත්ත. "අතට අහුවෙන හැම එකකින්ම ආණ්ඩුවට දමල ගහන්න ගිහින් සුන්බුන් කට්ටිය ඇණලා ඉන්නෙ. 'විගණකාධිපති පත්කරලා නෑ මහා විනාශයක් වෙන්නෙ' කියලා අඬන ගමන් විගණකාධිපති පත් කරන්න නොදී ව්‍යවස්ථාදායක සභාවෙ තමන්ගෙ කට්ටිය ලව්වා පත් කරන්න නොදී කකුලෙන් ඇද්දා. දැන් ඒ ඔක්කොම බාල්දි පෙරළිලි ඉවරයි. දැන් දැක්කනෙ සංවර්ධන නිලධාරීන්ගෙ උපවාසෙට උදේ හවස ගිහින් ලකුණු දාගන්න හැදුව. තමන්ගෙ පාලනයකදි ගුරු සේවෙට විභාග නැතිව බඳවාගන්න බවට ලේවලින් අත්සන් කරල දෙනව කියලත් කිවුව. අන්තිමට එයාලා සාකච්ඡාවට ගිහින් ජනාධිපතිට කිවුව අපිව පාවිච්චි කරන්න හැදුවට අපි කාටවත් පාවිච්චි වෙන්න දෙන්නෙ නෑ කියලා. සුන්බුන් කට්ටියට රෙදි නෑ... ඔන්න ඔහොමයි සුන්බුන් නඩේ රට ගොඩනගන්න සහය වෙන්නෙ" සමන කියලා ඉවරවෙන කොට පොලිටික්ක ඔළුව නමාගෙන මේසෙ උඩ තියපු මොඩියුල් පොත් ටික එකතු කරනවා.

## කවුළුව හැර තබමි

# සැබෑ නිදහස තව බොහෝ දුරය...



සෑම වසරකම පෙබරවාරි 04 නිදහස් දිනය ලෙස නම් කර ඇත. මෙම පෙබරවාරි 04ට ඔය කියන නිදහස ලබා වසර 78කි.

මාක්ස්වාදයට අනුව මිනිසුන්ට සැබෑ නිදහස ලැබෙන්නේ එක් පංතියක් විසින් තවත් පංතියක් සූරාකෑම අහෝසි වූ විටය. එක් පංතියක් විසින් තවත් පංතියක් පාගාගෙන සිටීම අහෝසි වූ දාටය. ඒ අනුව සැබෑ නිදහස තවම පේනතෙක් මානයකවත් නැත. ප්‍රාග්ධනයේ වියගසින් ශ්‍රමිකයා මිදෙන තුරු ඒ අනුව සැබෑ නිදහසක් මිනිසුන්ට නැත. නමුත් මීට වසරකට පමණ පෙර ශ්‍රී ලාංකික මිනිසාට යන්තමින් හෝ නිදහසේ හුස්ම පොදක් ගැනීමේ යම් හෝ විවරයක් විවෘත විය. ඒ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට මෙරට තුළ පිහිටුවා ගැනීමේ ජයග්‍රාහී අවස්ථාව රටේ ජනතාවට උදාවූ නිසාය. ඒ අනුව අපිට දැන් සමාජ පරිවර්තනයක ඉඩකඩ විවර වී තිබේ. එහෙත් අපේ රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසක් තවමත් ඊට අනුරූපව චින්තන පරිවර්තනයකට ලක්වී නොසිටීම රටේ අවාසනාවකි. සාටකයක් දුටු පමණින් තම ශරීරයේ නවන්න පුළුවන් හැම අස්ථියක්ම නවා එම සාටක ධාරියාට වන්දනා මාන කරන දසුන් තවමත් අප රට තුළ සුලභය. මිනිසා මතවාදීවම සන්නද්ධ වනවා යනු පළමු කොටම මේ චින්තන වහල්භාවයෙන් මිදීමය.

ඉතිහාසයේ වහලුන් වහල් හිමියන්ට විරුද්ධව සටන් වදින විට බොහෝ වහලුන් ඊට විරුද්ධ වී ඇති බව අපි අසා ඇති ඉතිහාස කථාවයි. එසේ වූයේ ඇයි? තමන්ට දිනපතා ලැබෙන කෑම වේල් ටික නැතිවේ යැයි බියෙනි. දැනුදු අපේ රටේ බත් පැකට් එකට, අරක්කු ටිකට රුපියල් සතවලට යටවී තම දේශපාලන ජීවිතය කිළිටි කරගෙන අඳුරුකර ගන්නා උදවිය දුටුවිට ඔබට සිහියට එන්නේ කවුරුන් ගැනද?

ඉදින් 78වැනි නිදහස් දිනයේදීවත් හරි දේ තෝරා බේරා ගැනීමේ නිදහස් සිතුවිල්ල සියලු ජනයාට පහළ වේවායි අපි හදවතින්ම ප්‍රාර්ථනා කරමු.

# ස්ත්‍රියකට ඇයි මෙතරම් ගැරහිලි...



පැරණි දේ අභාවයට ගොස් අලුත් දේ නිර්මාණය වීම ඉතිහාස නියමයයි. අලුත් දේ බිහිවන විට පැරණි ආකල්පමය අවතාර ඊට එරෙහිව නින්දා අපහාස කිරීමට, අලුත් දේ වෙනුවෙන් පෙනී සිටින නියමුවන්ට කුණු කතන්දර ගෙතීම ඊටත් එහා ගිය ප්‍රවණතාවයකි. අද අපේ රටේ දේශපාලනය තුළ අපි එය අත්විඳිමින් සිටිමු. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හමුවේ අද හරිනි අගමැතිනිය ප්‍රමුඛ නියමුවන්ටද මුහුණ දීමට සිදුවී ඇත්තේද එවැනිම අවාසනාවන්ත තත්වයකටය. ගැහැනියකට කළ හැකි දරුණුම ගණයේ අපහාසවලට අද ඇයට මුහුණදීමට සිදුවී තිබේ. මෙය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයට වඩා අපේ රටේ කුණු වී ඕජස් ගලන විපක්ෂ පජාත දේශපාලනයේ විහිළුසහගත ප්‍රකාශනයකි.

අර ලෙනින් වරක් කීවාසේ ඉන්දියානු යෝගියෙක් තම නාබිය දෙසට හිස ඔබාගෙන භාවනාකරන්නාක් මෙන් අපේ රටේ සමහර නරුමයන්ද ලිංගිකත්වය වටා කැරකීම අද තමන්ගේ ප්‍රමුඛම දේශපාලන කාර්යය කොටගෙන තිබේ. අද ඔවුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කතාකරන්නේයැයි කියමින් ස්ත්‍රියක් මුල්කර ගනිමින් ඇයට එරෙහිව ඉතාමත් නින්දිත ගණයේ බොරු, අවලාද නැගීමය. මෙය තනි ඇයට එරෙහිව නොව මුළු කාන්තා පරපුරටම එරෙහිව ගෙන යන නින්දිත, අප්‍රසන්න ප්‍රහාරයකි. තම අතට අහුවෙන කුමන හෝ කුණු කැබැල්ලකින් ගසා මේ ආණ්ඩුව බිඳ වැට්ටවිය හැකිදැයි බැලීම අද සුන්බුන් විපක්ෂයේ ප්‍රමුඛම කාර්යභාරය වී තිබේ.

විපක්ෂයේ පිරිමි සංවාද භාෂාව තුළ ස්ත්‍රීන්ට එරෙහි හැසිරීම වඩ වඩා දිස්වේ. අධ්‍යාපන ප්‍රතිසස්කරණ වෙනුවට "ආප්ප" ආදේශ වන්නේ එනිසාය. අවාසනාවන්තම දෙය නම් විපක්ෂයේ සමහර ස්ත්‍රීන්ද දැනුවත්ව හෝ නොදැනුවත්ව ඊට අත්වැල් සැපයීමය. සමාජයේ ඉදිරියේ 'ශුද්ධ' වූ රංගනයක යෙදෙන මොවුන්ගේ ඔළු ගෙඩි වැඩකරන ආකාරය දැන් මුළු රටටම හෙළිදරව් වී හමාරය. ලාංකේය සහෝදරියනේ, දැන් නුඹලාගේ නිහඬතාවයේ කාලය අවසන් වී තිබේ. සියලු දෙනාටම ගෝත්‍රවාදයෙන් එළියට ඒමේ කවුළු විවෘතව ඇත. අවශ්‍ය වන්නේ නුඹලාගේ පා එසවීම පමණි.

# නාමල්ගේ ඔඩෙස්සා සෆාරිය...



අපේ කාලයේ වඩාත් රැඩිකල් හා උත්කර්ෂවත් අවස්ථාවලට අනුකූලව ජීවත් වීම සඳහා, අපේ සංස්කෘතිය විසින් තවම සම්පූර්ණ ලෙස ගොඩ නඟා නැති, එසේ වුවත් එවැනි බිහිවීමක් අනිවාර්යයෙන් අවශ්‍ය කරන අලුත් වර්ගයක මිනිසුන් අද අපට වුවමනාය.

මාක්ස් දේශපාලනය යනුවෙන් යමක් සංකල්ප ගත කරද්දී ඉන් ඔහු අදහස් කළේ සමාජ දේශපාලනය යන්නය. එතනදී ඔහුගේ මුඛ්‍ය වුවමනාවක් වූයේ පවුලෙන් උපුටා ගත් මිනිස් සබඳතාවල සීමාකම්කම් පුපුරුවා ගැනීමට සමාජය පාවිච්චි කිරීමය.

පවුලෙන් උපුටා ගත් මිනිස් සබඳතාවල සීමාකම් පුපුරුවා ගැනීමට අසමත් මෙන්ම එය ජීවිත කාලය තුළම සිදු කළ හැකි දෙයක් නොවන බවට යළි යළිත් සනාථ කරන ඔළුවක් සහිත මිනිස් ශරීරවලට ලාංකේය දේශපාලනය තුළ හොඳම උදාහරණ දෙකක් තිබේ. එකක් නාමල්ය. අනෙක සජිත්ය. මේ ප්‍රමුඛ සජීවී උදාහරණ දෙක මේ වන විට එය නැවත නැවතත් සනාථ කරමින් සිටී. ආසන්නතම උදාහරණය නාමල් මේ ඊයේ පෙරේදා ඉන්දියාවේ ප්‍රාන්ත "ඉස්කෝලයක" පොඩි දරුවන් ඉදිරියේ කළ නවතම රංගනයය. මිනිසුන් රැවටීමට මේ තරම් ගොබ්බ ලෙසට දේශපාලනය කරන චරිතවලට තවමත් ලාංකේය දේශපාලනය තුළ රැඳීසිටීමට ඉඩකඩ විවරවී තිබෙන්නේ ඇයිද යන්න අපේ රටේ සංස්කෘතික මිනිසා තවමත් ගොඩනොනැගී තිබීම හා සම්බන්ධ වේ.

සමාජ පසුගාමීත්වයන්, පවුල තුළට ඉන් කාන්දුවන පසුගාමී මිනිස් සබඳතාත් දේශපාලනයට මුසුවී පවතින තුරු නාමල්ලා වැනි තක්කඩින්ට මේ රටේ ඇතැමුන් අරභයා තවදුරටත් රැවටීමේ කලාව කරගෙන යා හැකිය.

2026 ජනවාරි 06

# ආපදා බලපෑමට ලක්වූ ජනජීවිත ඉක්මණින්ම යථා තත්වයට ගේනවා

ශ්‍රී ලංකාවට 2025 නොවැම්බර් මස 26, 27. 28 සහ 29 යන දිනවල ඉතිහාසයේ අන් කිසිම අවස්ථාවක අත්විඳින්න සිදු නොවුණු විධියේ බරපතළ ස්වාභාවික අපදාවකට මුහුණ දෙන්න සිද්ධ වූ බව අපි දන්නවා. "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ඇති වුණු ඒ ආපදාව මුළු රටේම ජනතාවට දරාගන්න සිද්ධ වුණා. ඒ ආපදාව තුළින් අඩු වැඩි වශයෙන් දිස්ත්‍රික්ක 25ටම හානි සිද්ධ වුණා. ඒ වුණු ස්වාභාවික ව්‍යසනය නිසා අවතැන්වූ පවුල්, පුද්ගලයන් යම් ප්‍රමාණයක් දිස්ත්‍රික්ක ගණනාවක තවමත් සිටින අතර, විශේෂයෙන්ම රටේ මධ්‍යම කඳුකරයට විශාල හානියක් සිද්ධ වෙලා තිබෙනවා වාගේම, එම ප්‍රදේශ විශාල වෙනස්කම්වලටත් භාජන වෙලා තිබෙනවා. ඇත්තවශයෙන්ම අපි මීට පෙර නොදුටු අන්දමේ බලපෑමක් මේ ව්‍යසනය නිසා අපට අත්විඳින්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් රජය දැනටත් යම් යම් ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. ඒ මොහොතේ සිද්ධ විය යුතු දේවල් සඳහා ප්‍රතිචාර දක්වනවා වාගේම, මේ ආපදාවේ බරපතළකම තේරුම් අරගෙන, මේ ආපදාව නිසා අපේ රටේ පවුල්වලට, අපේ භූමියට ඇති වෙලා තිබෙන බලපෑම අවම කර ගැනීමේ විශාල වැඩ පිළිවෙළක් එක්ක අපි ඉදිරියට යමින් සිටිනවා.

මේ ආපදාව නිසා හානියට පත් වුණු ජනතාව අතරින් කොටසක් තවමත් කඳවුරුවල ඉන්නවා. ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා, මේ වනකොට අපේ සුරක්ෂා මධ්‍යස්ථාන 225ක් පවතින බව, පවුල් 6,592ක් ඒ මධ්‍යස්ථානවල ඉන්නවා. මේ වනකොට ගණන් බලා තිබෙන විදියට පූර්ණ නිවාස හානි 6,037ක් සිද්ධ



අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය

**ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය**

ඔවුන්ගේ ඥාතීන් සහ යහළුවන් සමග සිටින ඒ ප්‍රමාණය සුරක්ෂා මධ්‍යස්ථානවල සිටින ප්‍රමාණයටත් වඩා වැඩියි කියලා තමයි අපි ගණනය කරලා තිබෙන්නේ. ඒ අනුව මේ ආපදාව නිසා ඇති වෙලා තිබෙන තත්වය තවම සාමාන්‍ය තත්වයට පත් වෙලා නැහැ කියන එක ඉතාම පැහැදිලියි.

විශේෂයෙන්ම මහජන ආරක්ෂක ආඥාපනත යටතේ පැන වූ හදිසි තත්වය අපට තවදුරටත් දික් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේත් මේ ආපදාවට ලක් වූ පුද්ගලයන් සහ ඒ පවුල් සඳහා අත්‍යාවශ්‍ය සේවා නොකඩවා පවත්වා ගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය පවත්වාගෙන යාමට සහ ඒ තනතුර ප්‍රකාශයට පත් කිරීමටයි. ඒ හරහා අපට අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට හැකි වී තිබෙනවා. ඒක මේ තත්වය තුළ තවම අත්‍යවශ්‍යයි කියන හැඟීම අපට තිබෙනවා. මේ කරුණුවලින් එය ඉතාම පැහැදිලියි.

මේ අවස්ථාවේ මා තව දෙයක් කිව යුතුයි. අපි මේ හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කරලා. ඒ නීතිය මේ වෙලාවේ පාවිච්චි කරන්නේ මේ ආපදා තත්වය කළමනාකරණය කිරීමට මිසක්, වෙන කිසිම දේකට නොවෙයි කියන එක මම ඉතාම වගකීමෙන් ප්‍රකාශයට පත් කරනවා. මේ ආපදාව තුළ ඇති වෙලා තිබෙන නිශ්චිත තත්වයත්, මේ ඇති වෙලා තිබෙන හදිසි සහ සංකීර්ණ තත්වයත් තුළ ඉතාම ඉක්මනින් ප්‍රතිචාර දැක්විය යුතු නිසාත්, එය සංකීර්ණ ක්‍රියාවලියක් නිසාත්, තත්වය වෙනස් වෙමින් පවතින සන්දර්භයක් පවතින නිසාත්, රජයේ නිලධාරීන්ට ක්ෂණිකව ඒ අවස්ථාවලට මුහුණ දෙන්න සිද්ධ වන නිසාත්, ඔවුන්ට ඒ අවශ්‍ය නීතිමය පසුබිම සකස් කිරීම සඳහා පමණයි මහජන ආරක්ෂක ආඥාපනත යටතේ පනවන මේ හදිසි නීතිය අපි භාවිත කරන්නේ අනෙක් කිසිම අවස්ථාවකට අපි එය භාවිත කරන්නේ නැහැ.

"දිට්වා" සුළි කුණාටුවේ සුවිශේෂී ලක්ෂණ කිහිපයක් තිබෙනවා. ඒක වෙනත් අපදා තත්ව වාගේ නොවෙයි. වෙනත් ආපදා තත්වවලට වඩා මේකේ තිබෙන වෙනස්කම් තමයි. මේ තුළින් ඇතිවෙලා තිබෙන භූගෝලීය වෙනස්කම් ගැනත් අධ්‍යයනය කළ යුතු වීම. ඒවා තවම අවසන් වෙලා නැහැ. මෙය හරිම dynamic situation එකක්, මේකට මුහුණ දුන් පුද්ගලයන් නැවත පදිංචි කරවීමේදී ඒ භූමිය ගැන පරීක්ෂණ කරලා, NBRO ඒකෙන් වාර්තා ලබාගෙන, එහි ආරක්ෂිත බව තහවුරු කරගෙන තමයි ඒ ක්‍රියාවලිය කරන්න වෙලා තිබෙන්නේ.

අප සියලුදෙනාම දන්නවා. සාමාන්‍යයෙන් මේ කාලය තුළ නිරිතදිග මෝසම් සුළං එක්ක අධික වර්ෂාපතනයක් ලැබෙනවා කියලා. සාමාන්‍ය තත්වය තුළ මේ වර්ෂාපතනයෙන් ආපදා තත්වයක් ඇති වන්නේ නැහැ. මෙය සාමාන්‍යයෙන් අපේ දේශගුණික තත්වය සමග එන වර්ෂාවක් නමුත් අධික වර්ෂාපතනයක් නිසා නාය යෑමකට ලක්වුණු පොළොවක් එක්ක තමයි අද අපි ජීවත් වන්නේ. ඒ නිසා මේ වර්ෂාපතනයෙන් වුණත් අස්ථාවර තත්වයක් ඇතිවීමේ අවදානම තිබෙන්න පුළුවන්. මේක සාමාන්‍ය වර්ෂාපතනයක් ලැබෙන කාලයක් වුණත් නොවැම්බර් මාසයේ සිද්ධ වුණු ව්‍යවසනය නිසා ඉතාම පරිස්සමෙන් අවදානම අවම වන විදියට අවදානම පිළිබඳ ඉතා හොඳින් අධ්‍යයනය කරල තමයි අපට ක්‍රියාත්මක වන්න සිද්ධ වන්නේ. ඒ නිසා තමයි අපිට අවශ්‍යවෙලා තිබෙන්නේ මේ කාලය තුළ හදිසි තත්වයක් තවදුරටත් පවත්වාගෙන යන්න. ඒ නිසා අපි හිතනවා නිලධාරීන්ට ක්ෂණිකව රාජකාරිය කිරීමට හැකියාව ලබාදීම අත්‍යාවශ්‍ය සේවා පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය සහ අත්‍යාවශ්‍ය සේවා කොමසාරි ජනරාල් තනතුර පවත්වාගෙන යාම තවදුරටත් අත්‍යාවශ්‍යයි කියලා. මොකද මේ ආපදා තත්වය තවම අවසන් වෙලා නැහැ. මේ ආපදා තත්වයෙන් බලපෑමට ලක්වුණු පිරිසක් අදටත් ඉන්නවා. අපි උත්සාහ දරනවා පුළුවන් තරම් ඉක්මනට ඔවුන්ගේ ජීවිත යථා තත්වයට පත්කරන්න.

> **අපේ ආණ්ඩුව අපේ රජය රජයේ නිලධාරින්, ව්‍යාපාරික ප්‍රජාව, රටේ ජනතාව හා සියලු දේශපාලන පක්ෂ නියෝජනය කරන බොහෝ පිරිස් සමග Mobilize කරගන්න තිබුණු හැකියාව නිසා තමයි මේ ආපදාවට ශක්තිමත්ව මුහුණ දෙන්න පුළුවන්කම ලැබුණේ. විශේෂයෙන්ම මුල් කාලය තුළ අපට ඉතාම ඉක්මනින් බොහෝ තැන්වල යටිතල පහසුකම් යථා තත්වයට පත් කරන්න පුළුවන් වුණා.**

අපේ ආණ්ඩුව අපේ රජය රජයේ නිලධාරින්, ව්‍යාපාරික ප්‍රජාව, රටේ ජනතාව හා සියලු දේශපාලන පක්ෂ නියෝජනය කරන බොහෝ පිරිස් සමග Mobilize කරගන්න තිබුණු හැකියාව නිසා තමයි මේ ආපදාවට ශක්තිමත්ව මුහුණ දෙන්න පුළුවන්කම ලැබුණේ. විශේෂයෙන්ම මුල් කාලය තුළ අපට ඉතාම ඉක්මනින් බොහෝ තැන්වල යටිතල පහසුකම් යථා තත්වයට පත් කරන්න පුළුවන් වුණා. පාරවල් යථා තත්වයට පත්කරලා විවෘත කරන්න පුළුවන් වුණා. ඒ වාගේම විදුලිය සහ සන්නිවේදනය ඉක්මනින්ම යථා තත්වයට පත් කරන්න පුළුවන්කම ලැබුණා. සතියක් ඇතුළත ජල පහසුකම් ලබාදෙන්නත් පුළුවන්කම ලැබුණා. විනාශවෙලා තිබුණ යටිතල පහසුකම් විශාල මෙහෙයුමක්, ඒකාබද්ධ සහ සාමූහික වශයෙන් වූ විශාල කැපවීමක් තුළින් යථා තත්වයට පත්කර ගන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගෙම සියලු නිලධාරීන්ගෙන් ත්‍රිවිධ හමුදාවෙන් පොලිසියෙන් සහ ජාත්‍යන්තරයෙන් ලැබුණ සහයෝගයත් නිසා අපට කෙටි කාලයක් තුළ මේ ආපදාව තුළින් ඇතිවෙලා තිබුණ ඉතා භයානක තත්වයෙන් ජනතාව බේරාගෙන ඒ ජනතාවගේ ජීවිත සාමාන්‍ය තත්වයට ගෙන ඒමට හැකියාව ලැබුණා. සාමාන්‍ය තත්වය කියන්නේ, ජීවිත බේරාගැනීම පමණක් නොවෙයි. එහෙම නැත්නම් ඔවුන් සුරක්ෂා මධ්‍යස්ථානවල රඳවාගෙන සිටීම පමණක්ම නොවෙයි. සහන සේවා පවත්වාගෙන යමින් ඔවුන්ගේ ජීවිත යථා තත්වයට පත්කිරීමත් අත්‍යාවශ්‍ය කාරණයක් බවට පත්වෙලා තිබෙනවා.

## අභියෝගයක් වුවත්...

03 පිටුවෙන්

***විනාශ වූ පවුල්වලට නිවාස ලබා දීම ලොකු අභියෝගයක් නේද?***

දිට්වා ආපදාව නිසා නිවාස 6000ක් සම්පූර්ණයෙන්ම හානිවුණා. නිවාස එක්ලක්ෂ නවදාහක් විතර අර්ධ වශයෙන් හානිවුණා. අර්ධ වශයෙන් හානිවුණ නිවාස ප්‍රමාණයක් තිබෙන්නෙ නැවත ආපදාවක් සිදුවිය හැකි අධි අවදානම් කලාපවල. ඒ වගේම අධි අවදානම් කලාපවල කිසිම හානියක් නොවුණ නිවාස ප්‍රමාණයකුත් තියෙනවා. තමන්ගෙ නිවස අධි අවදානම් කලාපවල තියෙන මේ පවුල් සියල්ලටමත් සම්පූර්ණ නිවාස හානිවුන පවුල් 6000ටත් නිවාස ඉදි කළ යුතු වෙනවා. දළ වශයෙන් නිවාස 20,000ක් පමණ ඉදිකරන්න වේයැයි කියල අපි හිතන්නෙ ඒ නිසයි.

මුදල් අතින් ගත්තම මේ අයට අපි ලක්ෂ 50 බැගින් දෙන එක දැන් ආරම්භ කර තිබෙනවා. නමුත් අධි අවදානම් කලාපවලින් ඉවත්කරන පවුල්වලට පදිංචිවෙන්න සුදුසු ඉඩම් අපි ලබා දිය යුතුයි. කඳුකර දිස්ත්‍රික්කවල තිබෙන නායයාම් අවදානම නිසා ඉඩම් සීමිතයි. ඒ නිසා හැම පවුලකටම ලොකු ඉඩම් කැබැල්ලක් දෙන්න බැරි වෙන ප්‍රදේශ තිබෙනවා. එවැනි ප්‍රදේශවල නිවාස සංකීර්ණ ඉදිකරන්න සිදුවේවි. මේ විදියට අලුතින් ඉඩම් දෙන්නත්, නිවාස සංකීර්ණ ඉදිකරන්නත් අවශ්‍ය විකල්ප ඉඩම් මේ වෙනවිටත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් හඳුනගෙන තිබෙනවා.

වෙන තැනක නැවත පදිංචිකරන එක හරිම සංකීර්ණ ක්‍රියාවලියක්. පෞද්ගලිකව ඔබට මට මේ අත්දැකීමට මුහුණ දෙන්න සිද්ධ වුණොත් අපි කිසි කෙනෙකුට එය ලෙහෙසි වෙන එකක් නැහැ. මොකද **අපි පදිංචිවෙලා ඉන්න තැන තමයි අපේ ආර්ථික ජීවිතයත්, සංස්කෘතික ජීවිතයත්, සමාජ ජීවිතයත් කියන සියල්ල තිබෙන්නේ. ඒවා සඳහා පිළිතුරු සොයමින් තමයි වෙනත් තැන්වල පදිංචි කරන්න වෙන්නෙ. නමුත් ආණ්ඩුවක් ලෙසත්, රටක් ලෙසත් අපි ඔවුන් සමඟ සිටිනවාය කියන විශ්වාසය ගොඩනගාගන්න අප සමත් වී තිබෙනවා. ඒ විශ්වාසය බොහොමයක් අභියෝගවලට මුහුණ දෙන්න පහසු කරාවි.**

***මෙවැනි දැවැන්ත ඉදිකිරීම් කරන්න ඉංජිනේරුවන්, තාක්ෂණික නිලධාරීන් වගේම කම්කරුවන්ගේ හිඟයක් රට තුළ තිබෙනවා නේද?***

අපේ "2026 - ජාතික නිවාස වැඩසටහන" වගේම ආපදාවෙන් හානිවුණ නිවාස නැවත ඉදිකිරීමේ වැඩසටහනත් ප්‍රජා පාදක වැඩසටහන් ලෙසයි ක්‍රියාත්මක වෙන්නෙ. මූල්‍ය ආධාර වගේම මඟපෙන්වීම රජය මඟින් සිදු කරනවා. ඔවුන්ව පොළඹවන්නේ "තමන්ගෙම තැනක්" ඉදිකරගන්නයි. ඒ නිසා එම පවුල් ඒ කටයුත්ත සම්පූර්ණ කරගන්න උත්සුකයි.

නමුත් මේ කටයුතුවලට මඟ පෙන්වන්න, අධීක්ෂණය කරන්න ඉංජිනේරුවන්, තාක්ෂණික ශිල්පීන් ඇතුළු පිරිසක් අත්‍යාවශ්‍යයි. "Rebuilding Sri Lanka ජනාධිපති කාර්ය සාධක බලකාය" මගින් ආපදාවෙන් හානියට පත් නිවාස නැවත ගොඩනැගීමේ ක්‍රියාවලියට පාර්ශ්ව ගණනාවකින් බොහෝ පිරිසක් එකතු කරගන්න කටයුතු කරන්නේ ඒ නිසයි.

***කඳුකර ප්‍රදේශවල පරිසරය ආරක්ෂා කරගැනීමත් ජන ජීවිත ආරක්ෂා කරගැනීමත් වෙනුවෙන් අදාළ ආයතන ඒකාබද්ධ කරන, බලය සහිත රාජ්‍ය ව්‍යුහයක් අවශ්‍ය බව ජනාධිපති අනුර දිසානායක සහෝදරයා පවසා තිබුණා. මේ සම්බන්ද ඔබේ අදහස කුමක්ද?***

අපේ රටේ කඳුකර ප්‍රදේශය පවතින්නේ ඉතාමත් අවදානම් තත්වයක. දීර්ඝ කාලයක් තිස්සේ මේ ප්‍රදේශයේ සිදුකෙරුන අක්‍රමවත්, අවිධිමත් සංවර්ධනය විසින්ම කඳුකරය අනතුරේ හෙළා තිබෙනවා.

වෙනදා අපි මුහුණ දෙන අයහපත් කාලගුණ තත්වයකදී අපිට අසන්නට ලැබෙන්නෙ කඳුකර පළාත්වල නායයාම් සිද්ධි තුනක් හතරක් වගේ සංඛ්‍යාවක්. නමුත් මේ දිට්වා සුළිකුණාටුවේදී මහා පරිමාණ නායයාම් 1250ක් පමණ සිදුවී තිබෙනවා. ගම්මාන පිටින්ම නායයමින් සියගණනක් ජීවිත අපෙන් උදුරගෙන තිබෙනවා. බොහෝ ප්‍රදේශ ඊළඟට සිදුවෙන අයහපත් කාලගුණ තත්වයකදී නාය යෑමේ අධි අවදානමක තිබෙනවා. මේ තත්වයෙන් මුදාගන්න කෙටි කාලීන, මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන විසඳුම් ක්‍රියාත්මක කිරීමට යාන්ත්‍රණයක් අපට අත්‍යාවශ්‍යයි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com



යුද්ධයෙන් අවතැන්වූ පවුල් නැවත පදිංචි කිරීම වෙනුවෙන් නිවාස 2500ක් ඉදිකිරීම අරඹා...



ශ්‍රී ලංකාවේ මාලදිවයින් මහ කොමසාරිස් Masood Imad මහතා සමග හමුවක්



EDCS සාමාජිකයින්ගේ දූ පුතුන් වෙනුවෙන් සිසු නැණ ප්‍රණාම ශිෂ්‍යාධාර ප්‍රදානය කර...



පද්ම ශ්‍රී සම්මානලාභී ඉන්දීය ගායිකා අනුරාධා පෞද්වාල් හමුවී...




අනාගතය ඔබයි - අධ්‍යාපන ප්‍රතිසංස්කරණය පිළිබඳ කතිකාව

## අපි වැඩකරමින් සිටින්නේ න්‍යායාත්මක පදනමක් ඇතිවයි

### ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍ය කේ.ඩී. ලාල් කාන්ත සහෝදරයා

බලය ලබාගැනීමෙන් පසු මේ දක්වා රට තුළ සම්පූර්ණ නොකළ ධනේශ්වර ප්‍රතිසංස්කරණ සම්පූර්ණ කළ යුතු බවත් ලෙනින් විසින් එය උගන්වා ඇති බවත් පෙන්වා දුන් ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍ය ලාල්කාන්ත සහෝදරයා, මේ වන විට ආණ්ඩුවක් ලෙස වැඩකරමින් සිටින්නේ අඳුරේ අතපත ගාමින් නොවන බවත් න්‍යායාත්මක පදනමක් ඇතිව බවත් අවධාරණය කළේය.

ඔහු මේ බව පැවසුවේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සංවිධානයෙන් පසුගිය 21වැනි දින මහවැලි ශ්‍රවණාගාරයේ පැවති ලෙනින් සමරුවේදීය.

අධ්‍යාපන පරිවර්තනය සම්බන්ධයෙන් රජය සකස් කර තිබුණු ක්‍රියාවලියේ තිබුණු යම් අඩුපාඩුවක් නිසා සමාජය තුළ කැළඹීමක් ඇති කරන්න ප්‍රතිගාමී බලවේගවලට අවස්ථාවක් සැලසුණා. මේ අවස්ථාවේදී ලෙනින්ගේ ප්‍රකාශයක් අනුව ගත්තොත් පියවරක් ඉදිරියට, පියවර දෙකක් පස්සට කියන න්‍යාය අනුගමනය කරන්න සිදුවුණා. සමහර අය මේ කොටස විතරක් ලෙනින්ගෙන් උපුටා ගන්නවා. නමුත් ඒ ප්‍රකාශය සම්පූර්ණයෙන් තියෙන්නේ "පියවරක් පෙරට, පියවර දෙකක් පස්සට, යළි වේගයෙන් ඉදිරියට" කියලයි. පළමුවැනි කොටස විතරක් කියෙව්වොත් හැමදාම හිටපු තැනටත් වඩා පිටිපස්සෙන් ඉන්න වෙන්නේ.

ලෙනින් සම්බන්ධයෙන් ගත්තාම මේ අවස්ථාවේදී කියවා ගත යුතු යුතුකම් ගණනාවක් තිබෙනවා. ලෙනින් ලියා තිබෙන රාජ්‍යය කියන පොත් පිංච අපි කියවා ගත්තේ නැත්නම් මේ මොහොතට අදාළ අත්‍යවශ්‍යම දැනුම් සම්භාරයක් අයින් වෙනවා. ලෙනින් සහෝදරයා තරම් රාජ්‍යය ගැන පංති අර්ථයෙන් විග්‍රහ කළ වෙන කවුරුත් නැහැ. අපි ලබා තිබෙන ධනේශ්වර අධ්‍යාපනය ඉක්මවා ගිය අධ්‍යාපනයක් අවශ්‍ය නිසයි අපේ පක්ෂය පංති පහ කරලා දේශපාලන අධ්‍යාපනය පටන් ගන්නේ. එතැනින් ඉස්සරහට මේවැනි සම්මන්ත්‍රණ දක්වා විවිධ ආකාරයෙන් අධ්‍යාපනය ලබා දෙනවා. ඒ මත පදනම්ව අඛණ්ඩ අරගලයක් අපට තිබෙනවා. තවත් විදිහකට කීවොත් ආණ්ඩු බලය රාජ්‍ය බලය ගැනීම දක්වා අඛණ්ඩ අරගලයක් ඉදිරියට කරගෙන යා යුතුව තිබෙනවා.

සමහර අය අපෙන් අහනවා ආයතනවල වෙනසක් සිදුකර නැත්තේ ඇයි කියලා. අපට ලබාදී තිබෙන්නේ ආණ්ඩුව හැසිරවීමේ බලයයි. මහජන ඡන්දයෙන් තෝරා පත්කර ගත් ආණ්ඩුවක් ක්‍රියාකරන්නේ ව්‍යවස්ථාවෙන් ලබාදී තිබෙන බලය අනුවයි. ආණ්ඩුව හැසිරවීමේ බලය ලැබී තිබෙන්නේ ඒ අනුව. ඒ අර්ථයෙන් ගත්තාම සමහර පත්කිරීම් අපට වෙනස් කරන්න වෙයි. උදාහරණයක් හැටියට ගත්තාම, මහවැලි අධිකාරියට අධ්‍යක්ෂ මණ්ඩලයක් තිබෙනවා. හරිනම් ඒ අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරයක් පත්කරන්න ඕනෑ, මේ



අධිකාරියේ ඉන්න වෘත්තීය සමිති නායකයන්. නමුත් තාම එහෙම අදහසක් අපේ නැහැ. ආයතන තුළ වැඩකරන පංතියේ අවශ්‍යතාවය මත පදනම් වූ ක්‍රියාකාරිත්වයක් ඉස්සරහට එන්නේ එතකොට. අපිට සමාජ විප්ලවයක් කරන්න ඉතිරිව තිබෙනවා. ආණ්ඩුව ලබාගැනීම දක්වා අදිටන, ගැහැනු අපි එක මිටට, වෘත්තිය සමිති, ගොවි, ශිෂ්‍ය වගේ බලවේග එකට එකතු කරලයි අපි ආණ්ඩු බලය ගත්තේ. පංතියේ දියුණුතම කණ්ඩායම වන පක්ෂය වටා සමාජයේ ඉන්න බලවේග එකතු කළා. අපි පක්ෂ එකතු කළේ නැහැ.

## සියලු දෙනා එක්වී සිටින්නේ මුදල් පරදා යන විසල් මෙහෙයුමකටයි

### වැව්ලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය සමන්ත විද්‍යාරත්න සහෝදරයා



පීඩාවට පත්වූ ජනතාවට උපරිම කැපවීමෙන් ශක්තිය ලබා දීම සඳහා පන්දාහක බලඇණියක් නුවරඑළිය දිස්ත්‍රික්කයට පැමිණ සිටින බවත් ඒ අනුව දිස්ත්‍රික්කය පුරා දැවැන්ත ශ්‍රම මෙහෙයුමක් දියත් වීමට නියමිත බවත් පෙන්වා දුන් වැවිලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය සමන්ත විද්‍යාරත්න සහෝදරයා ඇතැමුන් තමන්ගේ ජීවිතයේ වටිනාම දේ ලෙස සලකන්නේ මුදල් වුවත් මුදල් පරදා යන මහා හැඟීමක් සිත් තුළ පුරවා ගත් විසල් මහා ශ්‍රම මෙහෙයුමක් වෙනුවෙන් මේ සියලු දෙනා එක්වී සිටින බව ප්‍රකාශ කළේය.

සමන්ත විද්‍යාරත්න සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 16වැනි දින වලපනේ ක්‍රීඩාංගණයේදී මුළු දුන් ශ්‍රම මෙහෙයුමේ ආරම්භ අවස්ථාවට එක්වෙමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කළ සමන්ත සහෝදරයා මෙසේද පැවසීය.

අද මේ ප්‍රදේශයට ඓතිහාසික දවසක්. ජාතික නිදහස පතා දියත් කළ අරගලවලට මූලිකත්වය දුන් අතීතයක් වලපනේ සහ ආසන්න ප්‍රදේශවලට තිබෙනවා. ඒ ඉතිහාසයේ මහා සංඝරත්නයේ මගපෙන්වීම සහ ආශිර්වාදය ලබාගෙන ජාතික නිදහස පතා ගෙන ගිය අරගල භූමිවලට ජනතාව යන්න ඇති. අදත් ගෞරවණීය මහා සංඝරත්නය ප්‍රමුඛ පූජ්‍ය පක්ෂය එකතු වෙලා ආගමික ආශිර්වාදයක් සමග ධෛර්යය දීලා අපි මුදා හරින්නේ වලපනේ සහ හඟුරන්කෙත ආසන දෙකේ විනාශ වූ වැව් අමුණු, පාරවල්, පාසල් ඇතුළු පොදු ස්ථාන මෙන්ම වෙනත් කටයුතුවලට ශ්‍රම මෙහෙයුමක් දියත් කරන්නයි. මේ කාර්ය පිළිබඳව දැනුවත් භාවයෙන් යා යුතු නිසයි අපි හැමදෙනාම මේ ලෙස එකතු වී ඉන්නේ. අපි මේ හමුවන දිනය වන විට දිට්වා සුළි කුණාටුව ඇවිත් මාසයකුත් දවස් විස්සක් වෙනවා. ගෙවී ගියේ කෙටි කාලයක් වුණාට අවුරුදු ගාණක් තුළ සිදුකරන මහා වැඩ කොටසක්. මේ රටේ ජනතාව සුළි කුණාටුවේ විනාශයට එරෙහිව කර තිබෙනවා. මේ වන විට මේ ප්‍රදේශවලට පහසුවෙන් ළඟා විය හැකි වුණත්, දිට්වා සුළි කුණාටුව පැමිණි අවස්ථාවේ වලපනේ නුවර, නුවරඑළිය, බදුල්ල යන ප්‍රදේශවලට ළඟාවීම කෙසේවත් කළ නොහැකි තැන් තිබෙනවා.

මේ ප්‍රදේශයේ දේශපාලන නායකත්වය රජයේ නිලධාරීන්, ත්‍රිවිධ හමුදාවට සහ පොලීසියට, වගේම ජනතාවත් එක්වී අතිවිශාල වැඩ කොටසක් සිදුකර තිබෙනවා. තවමත් අවසන් කර ගත නොහැකි වූ වැඩකොටස් සිදුකරන්නයි අපි කවුරුත් පක්ෂයක් හැටියට ඉතිහාසය පුරාම ගොඩනගාගත්ත සංස්කෘතියට අනුව මේ ප්‍රදේශයේ ජනතාවගේ ජීවිත ගොඩනගන්න ශක්තියක් වෙන්න පන්දාහක බලඇණියක් ඇවිත් සිටිනවා. වලපනේ අපි ඉන්න මේ ක්‍රීඩාංගණය එකම හිස් ගොඩකින් වැසී යනකොට කොත්මලේ ප්‍රදේශයට කළුතරින් කණ්ඩායම් ඇවිල්ලා දැවැන්ත මෙහෙයුමකට සූදානම් වෙනවා. මතුරට, නිල්දණ්ඩාහින්න, හඟුරන්කෙත, වලපනේ, ප්‍රදේශවල ඈත සිටින ජනතාව අද ඔබ එනකම් දෑස් දල්වාගෙන සිටිනවා. බදුලු පුරවරයෙන් එකතු වන ගෞරවණීය මහා සංඝ රත්නයේ පනස්පස් නමකුත් පෙරටුකොට ගෙන මේ ඓතිහාසික මෙහෙයුම දියත් කරනවා. අපේ රටේ පූජ්‍ය පක්ෂය සිවුර පැත්තකින් තියලා අඳනකඩය පිටින් වැලි කොට්ට ඔසවමින් වැව්, අමුණු හදන්න පටන් ගත්තා. ඒ වගේම ජනතාව තුළ මෙතෙක් නොතිබුණු අමුතු ප්‍රබෝධයක් ඇති වී ඉතා කෙටි කාලයක් තුළ ඉතිහාසයේ විප්ලවීය කාර්යභාරයක් ඉටුකරමින් සිටිනවා.

## අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දියුණු මානවයෙක් ගොඩනැගීම වෙනුවෙන්

### බුද්ධ ශාසන ආගමික කටයුතු හා සංස්කෘතික ඇමති ආචාර්ය හිනිදුම සුනිල් සෙනවි සහෝදරයා

**දරුවන්ට ඉගැන්විය යුත්තේ විභාගය සඳහා නොවන බවත් එය ජීවත් වීම සඳහා බවත් ජීවිතය ගැන පුළුල්ව දැකීම සඳහා බවත් පෙන්වා දුන් බුද්ධ ශාසන ආගමික කටයුතු හා සංස්කෘතික ඇමති ආචාර්ය හිනිදුම සුනිල් සෙනවි සහෝදරයා, විභාගය යනු ජීවිත අතරමග හමුවෙන එක කඩඉමක් පමණක් බවත් රජය අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට මුල පුරා තිබෙන්නේ එකිනෙකා සම්බන්ධයෙන් සහකම්පනයක් සහිත දියුණු මානවයෙක් ගොඩනැගීමට බවත් අවධාරණය කළේය.**

සුනිල් සෙනෙවි සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 22වැනි දින තංගල්ල නගර ශාලාවේ පැවති අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කතිකාවට එක් වෙමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු මෙසේද පැවසීය.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව අපේ රටේ මවලා තිබෙන අඳුරු චිත්‍රය බිඳ දාලා අපේ අඩුපාඩුකම් නිවැරදි කරගෙන ඉදිරියට යාමේ සූදානම අපේ හදවතේ තිබෙන නිසා ආදරණීය දෙමව්පියන් ඇතුළු ජනතාව හමුවී කරුණු පැහැදිලි කරන්න අපි ගමින් ගමට යනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණය කියන වචනයට මේ සංවාදය ලඝු වුණාට අපි සිදුකරන්න මුල පුරන්නේ සාකල්‍ය වශයෙන්ම අධ්‍යාපන පරිවර්තනයක් කරන්නයි. ඒ පරිවර්තනය නොකර ගෙන ශ්‍රී ලංකාව නමැති විශිෂ්ට රාජ්‍ය කරන්න නිර්මාණය කරන්න බැහැ. 1972, 1981, 1999 කාලවලදී තීව්‍ර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් බව වැඩිහිටියන්ට මතක ඇති. 2007 සහ 2015දී විෂය මාලා ප්‍රතිසංස්කරණය කළ බව මේ සභාවේ ඉන්න අයට මතක ඇති. මේ සියල්ල ඉක්මවා ගිය සාකල්‍ය අධ්‍යාපන පරිවර්තනයක් සිදු කිරීමට හේතු මොනවාදැයි අපි කල්පනා කළ යුතුයි.

මෙයට අවුරුදු සියයකට පෙර ලංකාවෙන් බිහි වී සිටි සුවිශේෂී අධ්‍යාපනඥයෙක්, කලා විචාරකයෙක් වූ ආචාරය ආනන්ද කුමාරස්වාමි එංගලන්තයේ පැවැති රාත්‍රී භෝජන සංග්‍රහයකදී ඉතා සුවිශේෂී ප්‍රකාශයක් කරනවා. "මෙතැන් සිට ශ්‍රී ලංකාවේ පමණක් නොව ඉන්දියාවේත් අඩසිය වසක තරම් කාලයක් වෙන් කළ යුතු ප්‍රධානම කටයුත්ත වූ කලී, අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සිදු කිරීමයි." කියලා අවධාරණය කළා. එතුමන් 1911 දී මේ ප්‍රකාශය කරමින් ඉදිරි අඩසියවස ගැන සඳහන් කළා. ඒ ප්‍රකාශය පරිදි නිසි අධ්‍යාපන පරිවර්තනයන් සිදුකර තිබුණා නම්, අප ඉදිරියේ පවතින්නේ මෙබඳු ශ්‍රී ලංකාවක් නොවෙයි.

අධ්‍යාපන පරිවර්තනයක් සිදු කළ යුත්තේ ඇයි කියන්න පැහැදිලි කෙරෙන



හේතු බැද්දේගම නවකතාව තුළ පවා ඉදිරිපත් වෙනවා. බලවතාට දුබලයා ගොදුරු වෙන හැටි, විචාරයකින් තොරව මේ තත්වය පැතිරී යන හැටි, හිත් පිත් නැති නැගී ගෙන එන වෙළඳ පංතිය මුදලට තැන දෙන හැටි, එයින් කියැවෙනවා. සිළිඳුලා, බබුන්ලා, පුංචි මැණිකෙලා ඈත ගම්වල තවමත් අපට හමුවෙනවා. මේ තත්වය බැරෑරුම් ප්‍රවාහයක් හැටියට සලකා බැලූ නිසයි අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට මුල පිරුවේ. ගුරු කේන්ද්‍රීය සහ විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය විසින් දරුවන්ට ගුණාත්මක සහ ප්‍රමාණාත්මක නොවෙන විභාග බරක් පටවා තිබෙන බව බොහෝ කලක සිට සාකච්ඡා වෙනවා.

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.